# ‘පට්ඨාන’ නමවෙනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධස්ස

කාම ලෝකය රූප ලෝකය අරූප ලෝකය කියන ලෝක ධාතූන් තුනේම ඉන්නා වූ මනස ක්‍රියාත්මක කරමින් ශ්‍රද්ධාව පෙරදැරි කොටගෙන ධර්මය ඇසීමට පෙළ ගැසී සිටින්නාවූ සියලුම සත්වයා කෙරෙහි වගේම අනිත් සියලුම සත්වයන් කෙරෙහි පතල මහා කරුණාවෙන් තමන් වහන්සේ අවබෝධ කර ගත්තාවූ ධර්මය මහා කරුණාවෙන් දේශනා කරමින් සත්වයන්ගේ මෝහය දුරු කරන්ට විසාල කැප වීමක් කරාවූ සත්වයන්ගේ සන්තානයේ කරුණාව දයාව මෛත්‍රිය පුබුඳුවන්ට විසාල කරුණාවෙන් කැප වීමක් කලාවූ සියලුම සත්වයන් කෙරෙහි පතල මහා කරුණාවෙන් පාරමී පිරුවාවූ සත්වයන්ගේ අභිවෘද්ධිය කැමති වුනාවූ සත්වයන්ගේ විමුක්තිය කැමති වුනාවූ ලෝකයට සරණක් වූ පිහිටක් වූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට සර්වඥතා ඥානයෙන් පිරුණාවූ සන්තානයක් ඇති මහා කරුණාවෙන් පිරුණාවූ සන්තානයක් ඇති අනන්ත අපරිමාණ බුද්ධ ගුණයන්ගෙන් බුද්ධ ඥානයන්ගෙන් පිරුණාවූ බැබලුනාවූ සන්තානයක් ජීවිතයක් දරන්නාවූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ සම්මා සම්බුදු රජාණන්වහන්සේගේ නිකලෙස් සන්තානයට සිතට සපර්ෂ වූ ඒ ප්‍රඥාවට දැනී පෙනී ගියාවූ අනන්ත වූ අපරිමාණ වූ ධර්ම සකන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සම්මා සම්බුදු රජාණන්වහන්සේට පාරමී ධර්ම බලයෙන් හිමිවුනාවූ මදුර වූ මනෝහර වූ ප්‍රනීත වූ අෂ්ඨාංග සමන්නාගත දේශනා සවරයෙන් ඒ දේශිත ධර්මය මහා කරුණාවෙන් ප්‍රඥාවෙන් දේශිත ධර්මය කනින් අසා නුවණින් මෙනෙහි කොට ධර්ම මාර්ගයට පෙළ ගැසී ධර්ම මාර්ගයට එක්කාසු වී ලොවතුරා බුදුරජාණන්වහන්සේ අවබෝධ කරගත්තාවූ ධර්මය අවබෝධ කරගෙන නිවනින් සැනසී ගියාවූ අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ධර්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ වූ කියා නිමක් කරන්ට බැරි ඒ උතුම් වූ සරණින් පිහිටෙන් ආරක්ෂාවෙන් ආනුභාව බලයෙන් සහ මේ පිංවත් සැම දෙනාම වැඩුවාවූ කුසල බලයෙන් වැඳ නමස්කාර කිරීමේ කුසල බලයෙන් කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ වෙලාවට අපේ මේ ධර්ම සාකච්ඡාව හැටියට ඉදිරිපත් කරගන්නාවූ මාතෘකාව යටතේ කියල දෙන ධර්ම කරුණු ටික අද මේ ලෝක වාසීව නොයෙක් රටවල් වල ඉඳගෙන අහගෙන ඉන්නාවූ පින්වතුන්ට ඉතාමත් හොඳින් තේරුම් ගන්ට ලැබේවා! පැහැදිලිව තේරුම් ගන්ට ලැබේවා! කිසිම පටලැවිල්ලක් නැතුව එක එක කාරණයක් කාරණයක් පාසා ඉතාමත්ම හොඳින් තේරුම් ගන්ට ලැබේවා! මෙනෙහි කරන්ටත් ලැබේවා! නිවැරදිව පැහැදිලිව ධර්ම කරුණු ටික තෝරාබේරාගෙන මෙනෙහි කරගෙන එයම ධර්ම මනසිකාරයක් කොටගෙන ඒ ධර්ම මනසිකාරය ඔස්සේ භාවනාවක් හැටියට ධර්මයත් එක්ක හිත පිරිසිඳු කරගනිමින් ගමන් කොට ලොවතුරා බුදුරජාණන් වහන්සේලා පසේ බුදුරජාණන්වහන්සේලා මහා රහතන්වහන්සේලා විසින් සැනසිල්ලේ නිවී අවබෝධකොට ගත්තාවූ සදාකාලික සැප ඇති නිවනින් සැනසෙන්ටත් ලැබේවා! නිවන් පිණිස මේ ප්‍රතිපදාව ඒකාන්තයෙන්ම හේතුවේවා කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

ඉතින් මේ ප්‍රාර්ථනාවත් එක්ක අද මේ පින්වතුන්ට ගත්ත මාතෘකාවක එක අංශයක් කියල දෙන්ට බලාපොරොත්තු වෙනවා. මේ දවස්වල අපි කථා කරන්නේ ප්‍රත්‍යය ධර්ම 24 පිළිබඳවයි. පට්ඨානය ඉගෙන ගැනීමේදී ප්‍රත්‍යය ධර්ම 24 ක් කියවෙනවා. ඒ ප්‍රත්‍යය ධර්ම 24 අප හිත උඩට නැවත නැවත - නැවත නැවත මතුකරගෙන - අරගෙන තියෙන්න ඕනැ. ඒ හිතට මතු කරගන්නාවූ ප්‍රත්‍යය ධර්ම - හිතට අවධිකරගන්නාවූ ප්‍රත්‍යය ධර්ම නිසා මේ දහම් වැඩ සටහන - සාකච්ඡාව හොඳට කරගෙන යන්න පුළුවන් වෙනවා. අවබෝධයක් එන විදියට කරගෙන යන්න පුළුවන් වෙනවා.

මේ දවස්වල කථා කරන්නේ ප්‍රත්‍යය ධර්ම 24. ඉතින් ඒකට කියනවා නමක් මාතෘකා හැටියට 'පට්ඨාන ධර්මය' කියල. ඉතින් කථා කරන්නේ ප්‍රත්‍යය ධර්ම 24. මේ ප්‍රත්‍යය ධර්ම 24 රේ දෙවෙනි ප්‍රත්‍යයයේ අපි මේ දවස්වල නැවතී සිටින්නේ. දෙවෙනි ප්‍රත්‍යය කියල කියන්නේ ආරම්මණ ප්‍රත්‍යය. ආරම්මණ ප්‍රත්‍යය වචනයෙන් එහෙම උනාට හරිම ගාම්භීර සවරූපයක් එහි තිබෙනවා. හරිම ගාම්භීර සවරූපයක් තිබෙනවා. එහෙම කියන්නේ අපි හැම එක්කෙනාගේම - 'සත්වයෝ' කියන අයගේ - සත්වයෝ කියල සලකන්නාවූ සැම කෙනෙකුගේම හිතක් තියෙනවා. හිත් වැඩ කරනවා. චෛතසික වැඩ කරනවා. රූප හිමිකමක්

තියෙනවා. සමහර හිත් වලින් නිවන දැකල තියෙනවා. සමහර හිත වලින් නිවන දැකල නෑ. රහතන් වහන්සේටත් සම්මුතියේ හැටියට සත්ව කියන වචනය පාවිච්චි කරනවා. මෛත්‍රී භාවනාවේදී රහතන්වහන්සේලාටත් මෛත්‍රී වඩනවා. ආර්ය සත්වයෝ සුවපත් වේවා! එතකොට මේ හිතක් තිබෙන්නාවූ සෑම කෙනෙකුටම ඒ හිතේ තිබෙනවා එක්තරා විදියක ගුණ සවභාවයක්. ඒ තමයි යමක් දැන් ගන්නා සවභාවය. යමක් දැන ගන්නා ගතිය. යමක් දැන ගැනීමේ ශක්ති විශේෂය. යම් දැන ගැනීමේ ගුණ විශේෂයක් හිතේ තියෙනවා. ඔය යමක් දැන ගැනීමේ ශක්ති විශේෂය - ගුණ විශේෂය - දැන ගැනීමේ ධර්ම විශේෂය ඒ හිතට තිබෙන නිසා තමයි යමක් දැන ගන්නේ. ඒවාට අපි කියනවා මොනවාද? දැන ගන්නා ශක්තිය කියන එකට කියනවා 'හිත' කියල. එහෙම නැත්නම් 'විඤ්ඤාණය' කියල. ඉංග්‍රීසියෙන් mind එක කියනවා. Consciousness එක කියල කියනවා. එතකොට මේ මොන වචනයෙන් කිව්වත් මොන භාෂාවල මොන වචන දාල කිව්වත් මේකේ තිබෙන්නේ අරමුණ දැනගන්න අරමුණ හිතන ගතිය.

දැන් මේ දවස්වල නැවත මතක් කරගන්න අපි කථා කරන්නේ 'අරමුණ'. පිළිබඳවයි. සිත පිළිබඳව නෙමෙයි. අපේ මාතෘකාව 'අරමුණ'. ඒ තමයි මේ හිතට දැන ගැනීමේ ගුණය දැන ගැනීමේ ශක්තිය තිබුනාට දැන ගන්ට දෙයක් නැත්නම් - මොනව දැනගන්ටද? දැන ගන්ට බෑ. එනිසා මේ දැනගැනීමේ ශක්තියට දැන ගන්ට දෙයක් තියෙන්න ඕන. ඒ තමයි 'අරමුණ' කිව්වේ. හිතට දැනෙන දේ. ඔය හිත තිබුණ පලියටම දැන ගන්ට බෑ. ඒකට දෙයක් ඉදිරිපත් වෙන්ට ඕන. දැන් මේ ඉදිරිපත්වන දේ අර දැන ගන්නා හිතට උපකාරයක් වෙනවා කියල අපි කිව්වනේ. යම්කිසි උපකාරක ගුණයක් - උපකාර වීමක් වෙනවා.

අපි බලමු මේ උක්ගස් කර්මාන්ත ශාලාවකට ගියහම ඒකෙ මැෂින් එකක් තියෙනවා. ඒ මැෂින් එකෙන් කරන්නේ උක්ගස් අඹරන එක. wheel දෙකක් එක තැන කරකැවෙනවා හරියට set කරලා - ඉතින් මේ wheel එකට ඇඹරෙන්න දෙයක් එපාය. ඇඹරෙන්න දෙයක් අවශ්‍යයි. එතකොට ඇඹරෙන්න දෙයක් නැත්නම් වැඩක් නෑනේ. හිතටත් අරමුණු කිරීම් වශයෙන් - හිතට වැඩ කරන්න දෙයක් ඕන. ඇත්තටම මේක කියාගෙන ගියාට, අපිට ලේසි කරුණු 5 යි. ලේසි කරුණු 5 යි තියෙන්නේ. අනිත් ඒවා ඔක්කොම අමාරුයි. ඒ කියන්නේ අරමුණු තියෙනවා ගොඩක්. රූප අරමුණු තියෙනවා. ශබ්ද අරමුණු තියෙනවා. සන්ධ අරමුණු තිබෙනවා. රස අරමුණු තිබෙනවා. පොට්ඨබ්බ අරමුණු තිබෙනවා. ඔය ටික අපිත් ඉතින් උදේ ඉඳල රෑ වෙනකල් දකිනවා අහනවා බලනවා - ඕව විඳින නිසා ඔය ටික - ටිකක් අපිට යම් කිසි හැඩ තලයක් දාගෙන හිතට තේරුම්

කරගන්ට - හිතා ගන්ට පුළුවන් කමක් නැත්තේම නෑ, තියෙනවා. වැඩේ අමාරු වෙන්නේ ඔතන නෙමෙයි. මේ මනසට වැටෙන - මනසට අහුවෙන සමහර තිබෙනවා අරමුණු. ඒවා පිළිබඳව අතපත ගාන්න ගියහම හරිම ගාම්භීර සවභාවයක් තිබෙනවා ඒවගේ. දැන් සරල උදාහරණයක් හිතන්ට බලන්ට. අපි මෙහෙම හිතමු. අරමුණ කියල කියන්නේ හිතට දැනෙන දේ කිව්වනේ. පේන දේවල් ඇහෙන දේවල් ගඳ සුවඳ රස සපර්ෂ ඒවා පංචදවාරයෙන් එන ඒවානේ. ඒවා ටිකක් ඔන්න අපිට දැනෙනවා පේනවා තේරෙනවා. ඔය දැකපු අහපු ඒවා පරණ වෙච්ච ඒවත් තියෙනවනේ. යම්තම් යම්තම් මතක ඒවත් තියෙනවනේ. ඒවා ටිකක් මතු කරලා ගන්ට කොට ටිකක් හරි අමාරුයි ඒක තේරුම් ගන්ට. මතක් කරනවා කියල අපි කියනවා. නමුත් මතක් වෙන විදිය - හිතට අරමුණු වෙන විදිය ටිකක් ගාම්භීරයි. සමහර අරමුණු තිබෙනවා හරිම සියුම් - හරිම සියුම්. අතිශය සූක්ෂමයි.

දැන් බලන්ට ඔය හිත ගැනත් හිතනවනේ. හිත ගැන හිතන කොට හිත හරිම සූක්ෂ්ම ධර්‍මයක්. හැබැයි හිත අරමුණු වෙනවා හිතට. චෛතසික ධර්‍ම ගැන බලන්ට. චෛතසික ධර්‍ම හිතට අරමුණු වෙනවා. හැබැයි හරීම සූක්ෂමයි. හරිම සියුම්.

අපි එකක් ගැන හිතමු බාහිර ලෝකයේ. රූප ටිකක් ඕලාරිකයි කියනවනේ. තවත් එකක් මම කියන්න ඕන මෙතනදී - අපි මේ කථා කරන්නේ ධර්‍ම පරාසයක. අපි ඉගෙන ගන්නවා සිත් 89 පිළිබඳව. විස්තර වශයෙන් 121යි. චෛතසික ධර්‍ම 52 ක් රූප 28 ක් නිර්වාණ ධාතුවක් යනාදී 170 ක මධ්‍යම ප්‍රමාණයේ ධර්‍ම සමුදායක්. මේ ටික තමයි මේ අරමුණු ආදී දේවල් කරගන්ට ඉදිරිපත් කර ගන්න දේවල්.

තවත් මීට අමතරව තියෙනවා යම් යම් දේවල්. දැන් අපි කියනවා 'අහස' කියන එක. 'අහස' කියන එක අපිට හිතන්න පුලුවන්. අහසේ plane යනවා. අහසෙ පක්ෂීන් පියාඹනව. ඉතින් අපි අහසේ වලාකුළු තියෙනවා කියල දන්නවා. අපේ හිතට අහස අරමුණු වෙනවා. අපි සමහර වෙලාවට මිනුසුන්ගෙන් අහනවා 'මොකද මේ උඩ බලාගෙන අහස දිහා බලාගෙන ඉන්නේ' කියල. අහස දිහා බලාගෙන ඉන්නවා කියල කිව්වත් මොකක් හරි දෙයක් දිහා බලාගෙන ඉන්නවා නමුත් අපේ හිතට අහස ගැටෙනවා. අපේ හිතට අහස අරමුණු වෙනවා. අහසට පාටක් නෑ. අහසට ප්‍රමාණයක් නෑ. අහසේ කොටු නෑ. අහසේ බරක් නෑ. නමුත් මේ අහස හරිම සියුම්. හරීම සියුම්. මේ සියුම් වෙච්ච අහස අපේ හිතට අරමුණු වෙනවා. හිත දැනගන්නවා අහස කියල. ඔය වෙලාවට අහස තමයි හිතට අරමුණු

වෙන්නේ. ඒක නිසා මේ අහසේ තිබෙනවා ඒ අහස ගැන අරමුණු කරන හිතටයි ඒ චෛතසික ටිකටයි තමන් අහස පැත්තට හැරිලා - අහස වන තමන් පැත්තට හැරිලා - අහස වන තමන් පැත්තට හිත හරවල - තමන් පැත්ත හිතවන්ට - තමා සම්බන්ධයෙන් චෛතසික ධර්ම පහළ කරන්ට - තමා සම්බන්ධයෙන් සිතුවිලි පහළ කරන්ට ඉදිරිපත් වෙන්ට පුළුවන් ගතියක් - ඉදිරිපත්වෙලා පෙනී හිටින්ට පුළුවන් ගතියක් ඔය අහසේ තියෙනවා. ඔය අහසේ අරමුණු වීමේ හැකියාව - ගුණය කාටවත් නොදැනෙන්ට තියෙන හින්ද තමයි - කාටවත් බලාගන්න බැරි වෙන විදියට - සර්වඥතා ඥානයට හැර - අනිත් කෙනෙකුට ලේසියෙන් බලාගන්ට බැරි වෙන විදියට ඒ අහසෙහි ඔය හිතකට උපකාර වෙන ගතිය තියෙන හින්ද තමයි අහසත් ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් යුක්තයි කියල කියන්නේ. අහසට තියෙනවා ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය.

තවත් එකක් තියෙනවා. ඒ තමයි මේක - අපි හිතමු පක්ෂියෙක් පියාඹලා යනවා. පක්ෂියෙක් පියාඹලා යන කොට ඒ පක්ෂියා ගහක ඉදල පියාඹලා යනවා. ඒ යනකොට ඒ පක්ෂියාට පියාඹලා යන්ට උදව් වෙන උපකාර වෙන ප්‍රත්‍යය වෙන ගතියකුත් ඕකේ තියෙනවා. ඒ පක්ෂියා යන්නේ අහසේ නිදැල්ලේ. අහසේ නිදැල්ලේ යනවා. කිසිම දෙයක් මේ හරියේ නෑ කිසිම සතෙක් මේ හරියේ නෑ 'මේ තියෙන්නේ මට යන්න පුළුවන් හරිය' කියල පක්ෂියාගේ හිතටත් ඒ අහස ප්‍රත්‍යය වෙනවා - අරමුණු වීම් වශයෙන් ආරම්මණ ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වෙනවා.

ඔය විදියට මේ හිත පිළිබඳව අපි හිතන කොට හිතත් ආරම්මණයක් හැටියට ප්‍රත්‍යය වෙනවා. මෙහෙම එකක් තියෙනවා. අපි පුංචි කාලේ ගිය ඉස්කෝලයක් තියෙනවා. හැදිච්ච වැඩිච්ච ගමක් නගරයක් ගෙදරක් දොරක් තියෙනවා. දැන් ඒවා සමහර වෙලාවට දැන් ගිහිල්ලා බැලුවොත් අපේ ගම - අපි මුල් කාලේ දැකපු ගම නෙමෙයි. අපේ ඉස්කෝල - අපි මුල් කාලේ දැකපු ඒ ගොඩනැගිලි තියෙන ඉස්කෝල නෙමෙයි. ඒ කාලේ තිබිච්ච ගස් නෑ. අලුත් ගස් හැදිලා. ඒ පිට්ටනිය නෙමෙයි. ඒ පාරවල් නෙමෙයි. ඒ පාරේ තිබෙන ගෙවල් නෙමෙයි. පුදුම විදියට වෙනස් වෙලා. නගරයකට ගියහමත් එහෙමයි. ඒ උනාට ඔය නගර හැදෙන්ට කලියෙන් ඔය ගෙවල් හැදෙන්ට කලියෙන් ඔය පිට්ටනි පාරවල් ගස් කොළන් හැදෙන්ට කලියෙන් තිබිච්ච සවභාවයක් යම් කිසි දවසක අපේ හිතට පොඩි කාලේ වැදිලා කැවිලා අපේ හිතින් ඒක හිතල ඔන්න දැන් මැකිලා අතීතයට ගිහිල්ලා. හැබැයි ඒ පරණ ගස් - පරණ පාරවල් - පරණ ගෙවල් - පරණ මිනිස්සු අද නැති උනත් ඒ අයගේ මතකයන් - ඒ අයගේ මතක රූප - ගම්වල මතක රූප - පාරවල් වල මතක රූප නිකම් සෙවනැලි වගේ ඉස්සරහට ඇවිල්ල ඒ පරණ ඒවා සම්බන්ධයෙන් පරණ දේවල් සම්බන්ධයෙන් බලපු කියපු දේවල්

සම්බන්ධයෙන් අපේ හිතට මතක් කිරීම් වශයෙන් - තව තව හිත් හදන්ට හිත් පහළ කරන්ට 'පරණ වෙච්ච අපි ගැනත් හිතන්ට ඕනෑ' කියල කියන්න වගේ මෙතැන දැනට තියෙන හිත අතීතය පැත්තට හරවා ගන්ට පරණ දේවල් පැත්තට හරවා ගන්ට පුළුවන් අමුතු විදියේ හැකියා ගුණයක් ඕකේ තියෙනවා. ඕක හින්දනේ මතක් වෙන්නේ. ඒක නිසා මේ අරමුණු - අතීත වශයෙන් තියෙන අරමුණු - අනාගත වශයෙන් තිබෙන අරමුණු - වර්තමාන අරමුණු - නිර්වාණ අරමුණු - ඊළඟට මේ අරමුණු ගත්තයින් පස්සේ අතීත වශයෙන් අනාගත වශයෙන් වර්තමාන වශයෙන් තියෙන දේවල් - දකින දේවල් - ඇහෙන දේවල් වර්ණ රූප - ශබ්ද රූප - ගන්ධ - රස - සපර්ශ ඒ පංච විධ රූප, ඊළඟට ඔය තිබෙන්නාවූ මරණාසන්න අවස්ථාවේදී ඇතිවෙන්නාවූ කර්ම නිමිති - ගති නිමිති - කර්ම - කාලත්‍රයට සම්බන්ධ නොවෙන ප්‍රඥප්ති වචන මේ හැම දේකම මේක තියෙනවනේ මහ පුදුම විදියට. ඒක නිසා අපි මාතෘකාව ගත්තට එකේ අන්තිම සියුම් සවභාවයක් තිබෙනවා. දැන් තව එකක් තියෙනවා ප්‍රඥප්ති ගැන කථා කරාට පස්සේ ඒකත් හරි සියුම්.

දැන් කරුණු දෙකක් අපේ පින්වතුන් මතක තියාගන්න. ඒක ප්‍රයෝජනවත් වෙනවා වැදගත් වෙනවා. කරුණු දෙකක් - ඒ තමයි හිතකට නිකං පහළ වෙන්ට බෑ. ඒකට අනිවාර්යෙන්ම අරමුණක් අවශ්‍යයි. එක්කෙනෙක් අහන්න පුළුවන් අනාගත අරමුණු කොහොමද වෙන්නේ කියල. අනාගත අරමුණු ගැන මෙහෙම හිතන්න පුළුවන්. දැකපු එකක් හරි ආධාර කරගෙන උපකල්පනාත්මක පින්තූර හදනවා. දැන් අපි හිතමු පිට්ටනියක් තියෙනවා. ඉඩමක් ගන්නවා කෙනෙක්. දැන් අනාගත අරමුණු කියන ඒවා දැන් නැනේ. අරමුණු කරන්නේ කොහොමද කියල කෙනෙක් අහන්න පුළුවන් හිතෙන්. ඒක වෙන්නේ මෙහෙමයි. ඉඩමක් ගන්නවා. ඉඩමක් අරගෙන එයා එතන ගෙයක් හදන්ට plan කරනවා. Plan කරන්නේ අනාගතේට මෙන්න මෙහෙම එකක් මෙතෙන්ට එනවා කියන සිතුවිල්ල දාල ඉඩමේ හදනවා මනෝමය ගෙයක්. ඒ ගේ දැන් නෑ. ඒ ගේ අතීතයේ තිබුනෙත් නෑ. අතීතයේ තිබුනෙත් නෑ - ඒ ගේ දැනටත් නෑ. එයා අර ඉඩම දිහා බලල ඒ ගේ හිතින් හයි කරනවා. ගේ ඉස්සරහ පැත්ත මෙහෙම - ගෙට එන්නේ පාර මෙහෙම - ජනෙල් මෙහෙම - වැට හතර වටේ - කුස්සිය මේ පැත්ත - වහලේ මේ විදියට - ඔය විදියට අනාගතයේ එන 'ගේ' මෙයා හදනවා. ඇත්ත වශයෙන්ම හිතින් එහෙම හිතන කොටම තමන්ගේ ඇස් දෙක ඉඩම පැත්තට හරවපු ගමන්ම අනාගතයේ හදන්න හිතපු 'ගේ' එයාට මතක් වෙලා එනවා. ඒක දැනට නෑ. අනාගතේ එන බවට අර 'හිතට' හොඳට වද්දල එනවා. ඉතින් ඒ සම්බන්ධයෙන් ගොඩ දේවල් හිතනවා. සමහර වෙලාවට වර්තමානයේ දෙයක් ආධාර කරගෙන එතෙන්ට දාල හයි කරන්ට පුළුවන්. හැබැයි මේක අනාගතයට එන රූපයක්.

අනාගතයට එන ධර්මයක් තමයි ඔය අරමුණු කරන්නේ. ඒ වෙලාවට බලන්ට අර අනාගතයට සම්බන්ධ දේවල් සම්බන්ධයෙන් - ඒ රූපය සම්බන්ධයෙන් අනාගතයට එන දේවල් සම්බන්ධයෙන් සිතුවිලි මවන්ට සිතුවිලි හදන්ට ඒ අරමුණ පුදුම විදියේ උපකාරයක් වෙනවනේ. ඒක නිසා කියනවා ඒ ආරම්මණයේ තිබෙනවා හයියක්. ඒ ආරම්මණයේ තිබෙනවා මහා බලයක් එය සම්බන්ධයෙන් හිතවන්ට. ඔන්න ඕකට කියනවා ආරම්මණ ප්‍රත්‍යය කියල. 'අහසේ' තියෙන - හිතට උපකාරවෙන ගතියට කියනවා ආරම්මණ ප්‍රත්‍යය කියල. අතීතයේ වෙච්ච දේවල් වලට හිතුවිලි හදන්න උපකාර වෙන ගතියට කියනවා ආරම්මණ ප්‍රත්‍යය කියල. ඒනිසා ආරම්මණ ප්‍රත්‍යය - අහසට - රූපවලට - හිත්වලට - චෛතසික වලට හැම එකෙකටම මේ ආරම්මණ ප්‍රත්‍යය තියෙනවා. ඒ නිසා ආරම්මණ ප්‍රත්‍යය තමයි අපි කථා කරන්නේ. ඒක තමයි අපේ මූල මාතෘකාව මේ දවස්වලට.

ඒ ආරම්මණ ප්‍රත්‍යය නිසා ආරම්මණයන්ගේ අනුභාවයෙන් ආරම්මණයන්ගේ ප්‍රත්‍යය ගුණයෙන් මතුවෙන දේවල් මොනවාද - ඒ කියන්නේ ප්‍රත්‍යය උප්පන්න ධර්ම මොනවාද - ඒ ආරම්මණය උපකාර කරගෙන මතු වී එන - පැලවී එන - හැදී එන - ඉදිරිපත් වන දේ තමයි 'සිත්' සහ 'චෛතසික ධර්ම'. සිතයි චෛතසික ධර්මයි තමයි අරමුණු නිසා හැදෙන දේවල්. ආන්න ඒ විදියට ආරම්මණ ප්‍රත්‍යය අපි තේරුම් ගන්ට ඕන. ඔය විදියට ගොඩ තියෙනවා සියුම් අරමුණු.

ඕලාරික ලෝකයට සම්බන්ධ දේවල් කියන්න පුළුවන් - ඒවායේ තිබෙන පාටයි සද්දයි අරව මේවානේ - හැබැයි භාවනාවට ගියාට පස්සේ ඇතිවන අරමුණු ටිකක් තියෙනවා. එව්වා අතපත ගහන එක හරි සියුම්. ඔය අහස වගේ. සූත්‍රාන්ත ක්‍රමයට චතුර්ථධ්‍යානයට ගියහම චතුර්ථධ්‍යානයේ තියෙනවා ප්‍රධාන බලවත් ගුණ දෙකක්. පුදුම විදියේ බලවත් උපේක්ෂාවක් තියෙනවා. හරී බලවත්. තද බල උපේක්ෂාවක් තියෙනවා. ඒ උපේක්ෂා ගුණයයි - සිහියයි - ඒකට කියනවා 'උපේක්ඛා සති පාරිසුද්ධිය' කියල. පිරිසිදු වෙච්ච සිහියක් තියෙනවා - උපේක්ෂාවක් තියෙනවා. ඒකෙන් හරිම සියුම් වෙච්ච ඒ චතුර්ථ ධ්‍යාන හිතෙන් අරමුණු කරනවා ප්‍රඥප්තියක්. ඒකට කියනවා 'අහස' කියල. ඒ අහස ප්‍රඥප්තිය හරිම සියුම්. 'මොකක්වත් නෑ' 'මොකක්වත් නෑ' 'නෑ' 'නෑ' 'නෑ' කියල මෙනෙහි කරනවා 'අහස' ප්‍රඥප්තිය - හරිම සියුම්.

තව එකක් තියෙනවා ඒ තමයි ආලෝකය. ආලෝකයත් හරිම සියුම්. මේවගේ සියුම් සූක්ෂම අරමුණු තිබෙනවා. ඒවත් හරිම ප්‍රබලයි. දැන් ඔය භාවනාවක් කරගෙන යනකොට හිත සන්සුන් උනහම සමහර අයට වැටහෙනවා දැනෙනවා

යම් යම් නිමිති. ඒව හිතේ පැලපදියන් වෙලා තිබෙන ඒවා නෙමෙයි. නමුත් ඒ නිමිත්ත අපිට දර්ශන කරන්න බැරි උනාට ඒක තව මතකයිනේ. තව මතකයි ඒක අත්විඳපු තැන - වෙච්ච දේ ඒවා හොඳට මතකයි. ඒවගෙත් තියෙනවා හිත් හදන්න පුළුවන් ගති. ඔන්න ඔය විදියට අපි තේරුම් ගත යුතුයි 'ආරම්මණය ප්‍රත්‍යය' සහ 'ආරම්මණ ප්‍රත්‍යය යෙන් හැදෙන හිත්' කියන ධර්මතා දෙක. මෙන්න මේ ටික තේරුම් ගන්ට අපි ඉස්සෙල්ල කථා කරා 'හේතු ධර්ම' 6 ක් - මේ කථා කරන්නේ ආරම්මණ ප්‍රත්‍යය ධර්ම පිළිබඳව.

තව එකක් අපි අද කථා කරමු. අපි යමු ඊළඟ ධර්මයට - මේ පිළිබඳව අපි ටිකක් සාකච්ඡා වශයෙනුත් ඉදිරිපත් කරගෙන. දැන් සරලව හිතා ගන්ට - අරමුණක් හැටියට - අරමුණු සවභාවයක් හැටියට හිත්වලට උදව් වන උපකාරවන ප්‍රත්‍යය වන දේට කියනවා මොකක්ද? 'ආරම්මණ ප්‍රත්‍යය' කියල. අරමුණක් නැතුව කවදාකවත් හිතක් එන්නේ නෑ චෛතසික එන්නේ නෑ කිව්වනේ. ඒකනිසා හැම වෙලේම සිත්වලට වැඩ කරන්ට පිහිට වෙන උපකාරවන දේ තමයි ආරම්මණ ගුණය. ඒ අරමුණු අරගෙන ප්‍රත්‍යය උප්පන්නයක් හැටියට අරමුණුවල හේතුවෙන් සහ අරමුණුවල උපකාරයෙන් මතුවෙන්නේ - සිත් 89 -සිත් 89 යටම අරමුණු තියෙනවනේ. චෛතසික 52 ටම අරමුණු තිබෙනවා.

ඒවගේම අරමුණු හැටියට තියෙනවා - සිත් 89 චෛතසික 52 යි - රූප 28යි. නිර්වාණ ධර්ම යයි ප්‍රඥප්ති ධර්මයයි කියන මේ ඔක්කෝටම තියෙනවා ආරම්මණ ප්‍රත්‍යය හැකියාව. ඒ නිසා පහළ වන්නාවූ සිත් 89 චෛතසික 52 යි ඔක්කොටම කියනවා ප්‍රත්‍යය උපන්න ධර්ම කියල. ප්‍රත්‍යය නිසා හට ගන්න ධර්ම.

අද මේ පින්වතුන්ට මම තව කොටසක් කියල දෙනවා. මේ තව කොටසක් කියන්න ඉස්සරවෙලා මම කැමතියි පොඩි කාලයක් ඉදිරිපත් කරන්න මේ පින්වතුන්ට මම මේ දක්වාම කියපු දේ මේ ප්‍රත්‍යය කතාවේ - දෙවෙනි ප්‍රත්‍යය ගැන කියපු දේ මේ පින්වතුන්ට වැටහුනාද - මේ පින්වතුන්ට තේරුනාද - මොකක්ද මේකෙන් තේරුම් ගන්නේ - මොකක්ද මේකෙන් වැටහුනේ - මොකක්ද මේකෙන් තමන්ගේ හිතට අහුඋනේ ආන්න ඒ කාරණය මේ වෙලාවේදී දැනගන්න එක හරි වටිනවා. මේ පින්වතුන්ගෙන් මේක දැන ගත්ත ගමන් මම වෙන පැත්තකට අද තව කරුණු ටිකක් එක්ක යන්න බලාපොරොත්තු වෙනවා. එනිසා දැන් කියපු ටික මම හිතනවා යම් කිසි හිතේ අවධිවීමක් - හිතේ පිහිටා සිටීමක් වෙන්න ඇති කියල. ඒ උනත් විනාඩි පහක විතර කාලයක් අරගෙන අපි තහවුරු කර ගනිමු මේ ආරම්මණයට තිබෙන ආරම්මණ ප්‍රත්‍යය ගුණය - ශක්තිය මේ පින්වතුන්ට වැටහුනාද තේරුනාද කියල. ඒ නිසා ඒ පිළිබඳව

පොඩ්ඩක් අහන්න ප්‍රශ්න තිබෙනවානම්. අපි එතනින් එහාට අනිත් පැත්තට හැරෙමු. හොඳයි ප්‍රශ්න අහන්න. තෙරුවන් සරණයි!

ප්‍රශ්නය - අවසරයි ගෞරවනීය ස්වාමීන්වහන්ස බොහොම පින් ඔබවහන්සේ පැහැදිලි කරල දීපු ටික තේරුණා. ස්වාමීන්වහන්ස දැන් ආරම්මණයක තිබෙන ප්‍රත්‍යය ශක්තිය ඒ ආරම්මණයේ තිබෙන ශක්තිය වගේම ඒ ආරම්මණය අරමුණු කරන පුද්ගලයාගේ හැකියාව අනුවත් වෙනස් වෙනවද කියල පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න. දැන් ඔබ වහන්සේ පැහැදිලි කරල දීපු විදියට මට තේරුනේ ප්‍රත්‍යනීක ධර්ම කියල දෙයක් තියෙනවද කියල ආරම්මණ ප්‍රත්‍යයට කියල.

පිළිතුර - පළවෙනි ප්‍රශ්නය ඒ තමයි පුද්ගලයාගේ හැටියට කියන එක මෙතනදී ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරගන්නේ නැති එක හොඳයි. හේතුව මේ ධර්ම කථාවේදී සිත් කථා කරනවා - චෛතසික කථා කරනවා - රූප කථා කරනවා - ධර්ම හැටියට කථා කරනවා - පුද්ගල ආමන්ත්‍රණයක් තියන්නේ නෑ. පුද්ගල ආමන්ත්‍රණයක් ගන්නේ නෑ. හේතුව උදාහරණයක් හැටියට ගන්න පුළුවන්, සූත්‍ර දේශනාවල වගේ පුද්ගල ඇඳි ගන්නේ නැත්තේ පුද්ගලයෝ නෑ - පරමාර්ථ ධර්ම සම්බන්ධයෙන් අමුතු දෙයක් මේකේ කියවෙන නිසා. එතකොට ධර්ම වල තිබෙන්නාවූ ශක්තීන් ස්වභාවයන් තමයි කථා කරන්නේ. තවත් මේ විදියට එකක් කියන්න පුළුවන්, අපි කථා කරා දවසක් මල් ගහක් ගැන. අපි අද හිතමු මෙහෙම. අලියෙක් ඉන්නවා පාරේ - අලියෙක් යනවා. දැන්මේ අලියා කියන්නේ ප්‍රඥප්තියක්. එතකොට අලියෙක් පාරේ යනවා. ඒ අලියා කියන ප්‍රඥප්තිය - ඒ දර්ශනය - ඒක ඇවිල්ල එක්තරා දර්ශනයක්නේ - යම්කිසි සවභාවයක්නේ. අලියා කියන ප්‍රඥප්තියයි එයාගේ රූපයයි ඒකෙ පිහිටීමයි වටේ ඉන්න මිනිස්සු බලනවා. ගොඩක් බලනවා. එතකොට අලියෙක් යනවා කියල පාරට එන්න පුළුවන් මිනිස්සු. හැබැයි ඒ අලියා කියන දර්ශනය අර වටේ ඉන්න මිනිස්සුන්ගේ හිත්වල ( මේ උදාහරණයක් හැටියට ගන්නේ) මහා විශාල විශාල වශයෙන් අලියා ගැන හිත් පහළ කරන්ට බලවත් ආරම්මණ ප්‍රත්‍යය ශක්තියක් එකේ තියෙනවා. සමහර අරමුණුවල ප්‍රත්‍යය ශක්තිය වැඩියි. සමහර අරමුණු වල මධ්‍යමයි. අලියාගේ තිබෙන හැඩය - ස්වරූපය - ගොඩක් අයගේ හිත්වල 'චිත්ත චෛතසික' හදන්ට 'ප්‍රත්‍යය උප්පන්න' හදන්ට හරි ආනුභාවයක් බලයක් තිබෙනවා. බුදුරජාණන්වහන්සේගේත් තියෙනවා. බුදුරජාණන්වහන්සේ දිහා ගොඩක් අය බලනවා. බුදුරජාණන්වහන්සේ ගැන කථා කරනවා. ඒ නිසා බුදුරජාණන්වහන්සේගේ බුද්ධ කියන වචනය - බුදුරජාණන් වහන්සේගේ ගුණ කියන ධර්ම - බුදුරජාවහන්සේගේ රූපය - මේ හැම එකකම තියෙනවා ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය වැඩියි. ඒ ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය වැඩි - ඒ බුද්ධ කියන වස්තුව

ගැන - බුද්ධ කියන රත්නය ගැන ගොඩක් සිතුවිලි මවනවා - සිතුවිලි හදනවා. ඒ කියන්නේ පහළ වෙනවා කියන එක. ඒ වගේ ලෝකයේ තිබෙනවා ප්‍රත්‍යය ශක්තිය වැඩි - මධ්‍යම - අඩු ආරම්මණ.

තව එකක් ඇහුව - ප්‍රත්‍යනීක ධර්ම පිළිබඳව කථාකිරීමේදී තියෙනවා ප්‍රත්‍යනීක ධර්ම. කණ්ණාඩි සාප්පුවක මනුෂ්‍යයෙක් වැඩ කරනවා. එයා කණ්ණාඩි හදනවා. කණ්ණාඩි විකුණන්න තියෙනවා. එතකොට එතෙන්ට යනවා මනුෂ්‍යයෙක් කණ්ණාඩියක් ගන්න. දැන් ඒ කණ්ණාඩිය ගන්න ගිය මනුස්සයාගේ හිතට අර කණ්ණාඩි ටික ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා. කණ්ණාඩි ටික පේනවනේ. කණ්ණාඩි දිහා බලාගෙන ඉන්නවා. කණ්ණාඩි වලට 'ප්‍රත්‍යය ශක්තියක්' තියෙනවා ඒ මනුස්සයාගේ හිතේ සිත් පහළ කරන්ට - චෛතසික ධර්ම පහළ කරන්ට කණ්ණාඩි සම්බන්ධයෙන්. හැබැයි කණ්ණාඩියට බෑ ඒ සාප්පුවේම තිබෙන්නාවූ අනිත් කණ්ණාඩි වලට දර්ශනය වෙන්න. ආන්න ඒ වගේ අනිත් එහෙකට ප්‍රත්‍යය නොවන්නාවූ දේට කියනවා - පහළ වෙන්නේ නැති එවාට කියනවා පච්චනීක ධර්ම කියල. පච්චනීක ධර්ම තියෙනවා. මම පච්චනීක ධර්ම වැඩිපුර කියන්නේ නැත්තේ ඒක පටලැවෙන නිසා. පච්චනීක ධර්ම තියෙනවා. තෙරුවන් සරණයි !

<u>ප්‍රශ්නය</u> - අවසරයි සවමීන්වහන්ස පොඩි ප්‍රශ්ණයක් තියෙනවා ඔබ වහන්සේ සඳහන් කළා හතරවෙනි ධ්‍යායනයේදී 'අහස' අරමුණු කරන්න පුළුවන් කියල. ස්වාමීන්වහන්ස එතනදී ඔබ වහන්සේ අදහස් කලේ 'අහස' පිළිබඳ තවත් සිතකින් තවත් සිතකට අරමුණු වීමක්ද ස්වාමීන්වහන්ස නැත්නම් ප්‍රඥප්තියක් වශයෙන් 'අහස' මෙනෙහි කරමින් අරමුණු කිරීමක්ද වෙන්නේ ස්වාමීන්වහන්ස පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - චතුර්ථධ්‍යානය හරිම ශාන්ත වූ - උපශාන්ත වූ - නිවී ගියා වූ - හෙල්ලෙන් නැත්තාවූ - පිරිසිඳු වූ - සුපරිසුද්ධ වූ - තිඵි භාවයට පත් උනාවූ - ආනෙඤ්ජාපත්ත වූ බොහෝම ප්‍රබල සමාධියක්. ඒ සමාධී සිතට බාහිර අහස අරමුණු වෙන්නේ නෑ. ඒකට අරමුණු වෙන්නේ අහස කියන ප්‍රඥප්තිය පමණයි. ප්‍රඥප්තිය කියල කියන්නෙ 'අහස' 'අහස' 'අහස' 'ආකාසයේ වෙන මොකක්වත් නෑ' 'අහස' 'අහස' 'අහස' කියල - ඒකට කියනව ප්‍රඥප්ති ආකාසය කියල. ඒක විතරයි පහළ වෙන්නේ - ඊට වෙනස් දෙයක් පහළවෙන්නේ නෑ. වෙන අහසක් ගන්න බෑ. බාහිර අහස ගන්න බෑ. ඒකට ප්‍රඥප්ති ආකාසය විතරයි.

බොහොම පිං ස්වාමීන් වහන්ස!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස සඳහන් කරා අනාගත අරමුණ ගැන. එතකොට ස්වාමීන් වහන්ස ඔබවහන්සේ ගත්තු උදාහරණයම ගත්තොත් යම් කිසි තැනක අනාගතයේ ගෙයක් පිළිබඳව කෙනක් සිහින මැවීමක් නැත්නම් හිතීමක් කරනවානම් එතෙන්දි ඒක අරමුණු වෙන්නේ සංඥාවක් හැටියටද ස්වාමීන්වහන්ස ඇත්තටම ඒකට අනාගත රූපයක් කියලද කියන්නේ සංඥාවක් කියලද ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි

<u>පිළිතුර</u> - සංඥාව උදව්වෙනවා - හොඳටම ගත්තයින් පස්සේ, අපි ඉස්සරවෙලා දැකපු ගෙවල් තියෙනවා - පාරවල් තියෙනවා - ගේට්ටු තියෙනවා. ඒවාගේ උපකාරයක් වෙන්න පුළුවන් හැබැයි ඒ ගේට්ටුවම නෙමෙයි. මේක හරිම සියුම් කියල කියන්නේ දැන් බලන්ට - අපි කුරුණෑගල පැත්තේ ගෙදරකට පන්සලකට ගිහිල්ලා - අපි හිතමු ගෙදරක් කියල - කුරුණෑගල ගෙදරක වහළය - ඒකෙ ජනෙල් - ඒකෙ බිත්තිවල පාට - ඊට පස්සේ වටේ වැට - ගේට්ටු - පඩිපෙළ - ඕව දැන් අපි දැකල තියෙනවා. ඕක දැකල දැන්, අපි ඒ 'ගේ' ඔය කියන සවරූපය ගන්න අපි හැරිලා හිටිය පැත්තක් තියෙනවා. අපි ගෙට මූණ දාල හිටපු පැත්තක් තියෙනවා. එක්කෝ නැගෙනහිර වෙන්න පුළුවන් බස්නාහිර හරි උතුර හරි අපි ඔය කියන රූපය - ඔය කියන පින්තූරය වද්ද ගත්තේ එක්තරා පැත්තකට හැරිලා. දැන් අපේ හිතේ එනකොට ඒ පැත්තට තමයි ඕක එන්නේ. අපි ඒ බලපු පැත්තත් එක්ක තමයි ඕක එන්නේ. දැන් අපිට ඒක හිතන්න පුළුවන් අහවල් තැන කියල. ඒ එනකොටම අතීත ආරම්මණයක් හැටියට තමයි ඕක එන්නේ. අතීත ආරම්මණයක් හැටියට ඒ 'ගේ' හරියට එනව. අපි ඕක දැන් ගිහිල්ලා බලනවා. එතකොට ඒක තියෙනවා. අපි ඒ අත්විඳින්නෙ වර්තමාන ආරම්මණය. ඉස්සෙල්ලා අපිහිතා ගන්නේ අතීත ආරම්මණය. දැන් ඔය දෙක කැවිලා තියෙන බව හැබෑව. දැන් අපි හිස් ඉඩමකට ගිහිල්ලා අර 'ගේ' අර බලපු හැටියටම අපිට අරකෙ හයි කරන්න බෑ. අර බලල තියෙන 'ගේම' මෙතෙන්ට දාන්න ගියාට අරමුණෙන් ගැලවිලා අහකට යනවා ඒක. ඒ කියන්නේ කොච්චර හිතන්ට ගියත් අපි මේ අලුත් ඉඩම උඩ - හිතල බලන්නකෝ අලුත් ඉඩම උඩ අර පරණ 'ගේ' හයි කරන්ට ගියාට හැම වෙලේම අපේ හිත යන්නේ අර කුරුණෑගල පරණ තැනටමයි. එකේ වදින්නේ නෑ. පොඩි සංඥාවක් නිකම් - ඒ වගේ ගෙයක් මෙන්න මෙතන පුළුවන් කියන - නැති ගෙයක් - අර වගේ එකකට හරි - ඒකට කිට්ටුවෙන් යන එහෙකට හරි අනාගත වශයෙන් නිකං සෙවනැල්ලක් මවන්න පුළුවන්. නමුත් අරක හිටින්නේ නෑනේ. අන්න ඒක හරි සියුම් ගතියක් - හරිම සියුම් ගතියක්. ඔය මනසේ වැඩ කැලි බලන්න ඕවා පොඩ්ඩක් එහෙට මෙහෙට

පෙරලන්න ඕන. දැන් හිතල බලන්නකෝ ඔය පරණ එකක් දාන්න පුලුවන්ද කියල.

දැන් බලන්න - මෙහෙම හිතන්ට බලන්ට - වෙන මනුස්සයෙක් ඉන්නවා. ලස්සන මනුස්සයෙක්. ලස්සන මනුස්සය අපි දැකල තියෙනවා කොළඹදී. හොඳට කාලා බීලා හිටපු හොඳ මනුස්සයෙක්. අපේ ගෙදර ඉන්නවා ටිකක් කැත පහේ එක්කෙනෙක්. ඉතින් මූණත් ඇදිල ගිහිල්ලා. දැන් අර ලස්සන මනුස්සයාගේ රූපය නිකං හිතින්වත් දාන්න බලන්න මෙයාට හයි කරන්න බලන්න එනවද කියල. හැමවෙලේම දෙකට කැඩිලා යනවා. මෙයා ප්‍රතික්ෂේප කරනවා. අරය වෙනම තියෙනවා. ඔය අතීත ආරම්මණ යයි වර්තමාන ආරම්මණ යයි අනාගතයට දාන්න යන එකයි හරි උත්සාහයෙන් හිගිල්ල කිට්ටු කරන්න ගියත් හැමවෙලේම වැටිලා යනවා. ඒක නිසා අනාගතේට අපි දානඑක දැනට නෑ. නමුත් අපි අර සංඥාවෙ උදව්වත් ඇතුව අර නැතිඑක අපි අමුතු විදියට පින්තූර ගතකර ගන්නවා. ඒක තාම අනාගත රූපය හැටියට සලකන්නේ. තෙරුවන් සරණයි!

බොහොම පිං සවාමීන් වහන්ස එතකොට ඇත්තටම අර රූපය කියන සතර මහා භූත ගති ඒවා මේවා ඔය අතීත අනාගත යන තැන් වලට යෙදෙන්නේ නැත්ද කියන ප්‍රශ්නෙ තමයි ආවෙ ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි සවමීන්වහන්ස උප්පත්ති සිත ආරම්මණ ප්‍රත්‍යය වශයෙන් භවාංග සිත ප්‍රත්‍යය උප්පන්න වශයෙන් තේරුම් ගත්තොත් හරිද සවාමීන් වහන්ස.

<u>පිළිතුර</u> - මෙහෙමයි මහත්තය ප්‍රතිසන්ධි සිත දැනට උත්සාහයෙන් උත්සාහයෙන් හිතුවොත් මේ වෙලාවට පහළ වෙන හිතට මුල් ප්‍රතිසන්ධි සිත ආරම්මණ ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වෙනවා, දැන් හිතන කොට. එතකොට ඉස්සෙල්ල ප්‍රතිසන්ධි සිත තමයි අරමුණ අපිට අල්ලලා දෙන්නේ - දැන් ඒ ප්‍රතිසන්ධි සිතේ අරමුණ හැටියට දැන් පහළ වෙන හිත ප්‍රත්‍යය උප්පන්නයි. ඊළඟට භවාංග සිත - අපි හිතනවා 'භවාංග සිත කොහොමද' – 'මොන වගේද' - එවිට ඒ භවාංග සිත 'ආරම්මණයයි' - ඒ ආරම්මණය ගැන හිතවන හිත් ටික 'ප්‍රත්‍යය උප්පන්නයි'. හැබැයි ප්‍රතිසන්ධි සිතට ප්‍රතිසන්ධි සිතම අරමුණු වෙන්නේ නෑ. ප්‍රතිසන්ධි සිතට අරමුණු වෙන්නේ කරුණු තුනයි. එක්කෝ කර්මය ආරම්මණය වෙනවා එක්කෝ කර්ම නිමිත්ත ආරම්මණය වෙනවා. එහෙම නැත්නම් ගති නිමිත්ත අරමුණු වෙනවා. ඔය ගත්ත එහෙකින් 'එකක්' විතරයි ප්‍රතිසන්ධි සිතට

ආරම්මණ ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වෙන්නේ. ඊළගට භවාංග සිත. භවාංග සිතටත් ඔය තුනෙන් එකක් තමයි ආරම්මණ ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වෙන්නේ. ඒ විදියටයි මහත්තය.

අප්‍රමාණ පිං සවාමීන් වහන්ස!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි සවමීන්වහන්ස දැන් ආරම්මණ ප්‍රත්‍යයෙන් අතීත අනාගත වර්තමාන හැටියට මේවා බලන කොට අපිට සක්කාය දිට්ඨිය දුරුකර ගන්න කොහොමද ඒක බලන්නේ. පොඩ්ඩක් කියල දෙන්න සවාමීන්වහන්ස !

<u>පිළිතුර</u> - මේවගේ තිබෙන්නේ ධර්ම සවභාව මිසක ඒවගේ පුද්ගල ඇඳී ශක්ති නෑ. දැන් current එක නිසා වතුර රත් වෙනවා - උණු වෙනවා නමුත් විදුලිය කියන එකේ එහෙම වතුර රත් වෙන ගතියක් තිබුනට පුද්ගල බලයක් ඒකට නෑ. ගුණ විශේෂයක් සවභාව ධර්ම විශේෂයක් විතරයි. ඉතින් මේ අනාගත වශයෙන් පවතින අරමුණු - ඒවා ගැන අරමුණු කරන හිත් මේවා ඇවිල්ල එහෙම - සක්කාය දිට්ඨිය කියල කියන්නේ පුද්ගලයෙක් ඉන්නව කියන එකනේ - එහෙම පුද්ගල සවභාව නෙවෙයි මේවා. නිකං අරමුණක් තියෙනවා ඒ අරමුණ තවත් ධර්ම වලට පෙනී ගෙන යනවා. එච්චරයි. ආරම්මණ ප්‍රත්‍යය ගුණය තියෙනවා අරමුණේ ඒක දැනගන්නාවූ හැකියාව ගුණය තියෙනවා හිතේ. එච්චරයි. ඉතින් එතකොට මේ ධර්ම 'ධර්ම' හැටියට බලන කොට 'මේ ධර්මයේ මේ ගුණය තිබෙනවා - මේ ධර්මයේ මේ ගුණය තිබෙනවා - මේ ධර්මයේ මේ ලක්ෂණය තිබෙනවා' - මේ විදියට බලන කොට ඒ ධර්ම සවභාව බැලීමම ඒ ධර්ම මාත්‍රා ඒ විදියට හිතීම දැනගැනීමම පුද්ගල දෘෂ්ටිය නැතිවීමට උපකාර වෙනවා. ආයෙත් ඒකට ගිහිල්ලා පුද්ගල ස්වභාවයක් එක්කාසු කරන්නේ ඇඳන්නෙ නෑ. ඒකෙන්ම ගලවලා යනවා. ඒකනිසා මේ අනාගත වශයෙන් අරමුණුවීම් - අතීත වශයෙන් තිබ්බව ඒවා අරමුණු වීම් ඒවා අරමුණු කිරීම් විතරයි. ඒවගේ කෙනෙක් පුද්ගලයෙක් නැහැ කියල මෙනෙහි කරන කොට ඒ මෙනෙහි කිරීමම තමයි ප්‍රතිපදාවක් වෙන්නේ. සක්කාය දිට්ඨිය නැති කරන්න. තෙරුවන් සරණයි

එතකොට ස්වාමීන් වහන්ස අපි මනසින් අතීතයක් අනාගතයක් පැනව්වොත් එතන අපි ලෝකයට අහුවෙලා වගේ කියල හිතුන ස්වාමීන්වහන්ස එහෙම හිතන එක වැරදිද? තෙරුවන්සරණයි!

එකේ කරන්නේ මෙහෙමයි. මේ ආරම්මණ ප්‍රත්‍යය යටතේ කථාකරන කොට ඒක දකින්න ඕනෑ මෙහෙමයි. අපි 'පනවනවා' – 'පැනවෙනවා' - එහෙම එකක්

තියෙනවනේ. දැන් ඔන්න මෙහෙන් හිතින් පනවනවා කියලා කියනවා. පනවනවා කියල කියන්නේ අමුතු දෙයක් නෙමෙයි හිතාගන්නව කියන එකනේ. හිතාගන්නවා. ඇයි හිතාගන්ට පුළුවන් කම තියෙන්නේ - හිතේ තියෙනවා එහෙම හිතවන ගතියක්. ඒක ඇවිල්ල කෙනෙක් නෙමෙයි. ඒක හිතට තියෙන හැකියාවක්. ඒ හිතට අවශ්‍ය කරන සංකලන ටික එක්කාසු උනායින් පස්සේ, එහෙම හිතක් ඔය විදියට යම් කිසි දෙයක් පිළිබඳව හිතා ගන්න ගතියක් තියෙනවා. ඒ හිතා ගන්න ගතිය තියෙන්නේ එහෙම ගති ස්වභාවයක් ධර්‍ම ස්වභාවයක් එකේ තියෙන හින්ද. ඊළඟට හිතාගන්න හිතට අරමුණු වෙන එකක් තියෙනවනේ ඒ අරමුණු වෙන එකත් ඔහේ නිකං මේ හිතට 'අනේ ඔන්න ඔහේ හිතාගත්තාවේ' කියන්න වගේ අරමුණක් හැටියට ඉදිරිපත් වෙනවා. ආන්න ඒ ධර්‍මතා දෙක මිසක වෙන මොකක්වත් නෑ ඒකෙ. පැනවීම් කියල එහෙම දේශනාවේ තිබුනාට එතන කරෙන්නේ හිතෙන් යම් කිසි දෙයක් ගැන එක විදියකට හිතාගන්න එක. ඒකට නමක් දාන එක. ඒකට නමක් දාල නිකං හිතෙන් අරමුණු කර ගැනීම. ඔය 'එකක්' හිතෙනවා 'අනිත් එක' හිතනවා. එකක් හිතනවා අනෙත් එක ඒකට අරමුණු වෙනවා. ඔය ධර්‍මතා දෙක විතරයි තියෙන්නේ. එතන පුද්ගලයෙක් නෑ. හිතනදේත් පුද්ගලයෙක් නෑ. හිතන එකෙත් පුද්ගලයෙක් නෑ. ඒවා ඇවිල්ල අමුතුම විදියේ - මෙන්න මෙහෙම එකක් තියෙනවා ඔය හැමතැනටම පුළුවන් තරම් අපි කරලා තියෙන්නේ 'මම' 'මම' 'මම' කියන එක පුළුවන් තරම් ගාවලා ගාවලා ගාවලා ඒක හැමතනටම කොටලා තියෙන හින්ද ශක්තියක් හැටියට හිතා ගන්න අමාරු ගතියක් තියෙනවා කෙනෙකුට. දැන් බලන්ට 'මට මෙහම හිතෙනවා' කියල කියනවනේ 'මම මෙහෙම හිතනවා' කියල කියනවනේ. මට මෙහෙම හිතෙනවා කියල කියන්නේ අර හිතට දැම්මනේ 'මම' කියල. මට මෙහම හිතෙනව කියන්නේ අර හිතට දැම්මනෙ 'මට' කියන ගතිය. 'මට' මෙහෙම අදහස් වෙනවා - 'මම' මෙහෙම අදහස් කරනවා . 'මම' මෙහෙම අදහස් කරනවා නෙමෙයි හිතේ තිබෙනවා යම් කිසි දෙහෙකට නිකං හිතීලා යන ගතියක් ඒ හිතීලා යන ගතියට 'මම' කියනඑක වැට්ටිලා තියෙනවා. ඒක අයින්කරගන්න බැරි වෙලා තියෙනවා. ඉතින් මේ විදියට ශක්තිය හැටියට හිතන කොට ගුණ හැටියට හිතන කොට ධර්‍ම හැටියට හිතන කොට පුද්ගලයෝ හැටියට නොසිතා ආන්න ඒකම තමයි මේ ආත්ම දෘෂ්ටිය නැති වීමට උපකාර වෙන ධර්‍ම සවභාවය ප්‍රතිපදාව.

හොඳයි ස්වාමීන් වහන්ස ඉතිරි කොටසට යොමු වෙනවද කාල වෙලාව අනුව

හොඳයි එහෙනම් අපි ඉතිරි කොටසට යමු. අද මේ පින්වතුන්ට යම් කිසි තේරුමක් මේ පිළිබඳව ඇති වෙන්න ඇති කියල මම විස්වාස කරනවා. අපි මේ

විදියට හිතමු. ප්‍රත්‍යය ධර්ම 24 ක් තියෙනවා කිව්වනේ. ප්‍රත්‍යය ධර්ම 24 රේ දැන් අපි දෙකක් පිළිබඳ කථා කරා. මේ ප්‍රත්‍යය ධර්ම 24 දෙවෙනි එකෙන් පස්සේ තිබෙනවා තව ප්‍රත්‍යයක් ගැන කියනවා ඒ තමයි තුන්වන ප්‍රත්‍යය 'අධිපති ප්‍රත්‍යය'. ඉස්සෙල්ලාම අපි මේ කාරණය තේරුම් ගන්න ඕනෑ. 'අධිපති ප්‍රත්‍යය'. මොකක්ද ඒ 'අධිපති ප්‍රත්‍යය'. ප්‍රත්‍යය කියන එක තේරෙනවා ඒ කියන්නේ යම්කිසි දේකට උපකාරවෙනවා කියන එක. හැබැයි අධිපති කියන එක තේරුම් ගන්ට ඕන. අධිපති කියල කියන්නේ යම් කිසි තැනක මොකක් හරි දෙයක් leadership එකක් දරනවනම් මොකක් හරි දෙයක ප්‍රධානත්වය දරනවනම් ආන්න ඒ ප්‍රධානත්වය දරන leadership එක දරන්නාවූ ධර්මයත් තිබෙනවානම් ඒක තමයි 'අධිපති' කියල කියන්නේ. දැන් ඔය තියෙනවනේ විදුලි transformer කියල. Transformer එකේ තියෙන්නේ විදුලිය පෙන්නේ නෑ. නමුත් ඒ විදුලිය පෙනෙන්නේ නැති උනාට එකේ තියෙනවා විදුලිය ප්‍රධානයි. ඒ විදුලිය ප්‍රධාන නිසා තමයි වයර් අදින්න හේතුව - විදුලිය ප්‍රධාන නිසා තමයි වටේට වැටවල් හගන්න හේතුව - විදුලිය ප්‍රධාන නිසා තමයි transfomer හදන්න හේතුව - ඉතින් විදුලිය හරි 'අධිපති' එතන. හරි බයයි. කිට්ටු වෙන්නේ නෑ. ඒකනිසා විදුලිය පෙන්නේ නැති උනාට අනිත් ඔක්කොම ටික control කරගෙන තමයි ඉන්නේ. අන්න ඒ වගේ ගතියක් - අධිපති ප්‍රත්‍යය - උපකාර වෙනව අනිත් ඒවාට. ඒ නිසා ප්‍රධානත්වයෙන් අධිපති සවභාවයෙන් අනිත් ධර්ම වලට උදව්වන උපකාර වන්නාවූ ලක්ෂණය තිබෙන දේවල් වලට කියනවා අධිපති භාවයෙන් අධිපතිතවයෙන් - උපකාරතවයෙන් උපකාර වෙනවා කියල.

එතකොට තව එකක් තියෙනවා අධිපතිය කියල කියන්නේ - දැන් අපි හිතමු ගෙදර තාත්ත - ගෙදර ප්‍රධානියා ගමනක් ගිහිල්ලා එනවා. එනකොට ළමයි ටික ඔක්කෝම කෑ ගහනවා දුවනවා පනිනවා, ඉතින් ඔහොම තියෙනවනේ. දැන් මේ ගෙදරක ප්‍රධානියා පියතුමානෙ - තාත්තනේ - සමහර ගෙවල්වල අම්ම ප්‍රධාන වෙනවා. දැන් මේ තාත්ත නැති වෙලාවේ හරියට සද්ද බද්ද කෑ ගහනවා දඟලනවා. ඉතින් දැන් තාත්ත කොහ හරි ගිහින් එනවා - ගේට්ටුවෙන් ඇතුල්වෙලා එන කොටම අර සද්ද බද්ද ඔක්කොම නැතිවෙලා යනවනේ. අර කෑගහපු කෑගැහිල්ල නවතින්ට පුදුම බලයක් අර පියතුමා ගාව තියෙනවනේ ඒ සද්දේ නවත්තන්ට කිසිම ඕඩරයක් නැතුව. තව එකක් තමයි මේ ඉස්කෝලවල Principal. ඒත් ඉස්කෝලේ අධිපතිනේ. විදුහල්පති. විදුහල්පතිතුමා නැති වෙලාවට ළමයි නටනවා දඟලනවා කෑගහනවා හැබැයි විදුහල්පති තුමා එනව කියපු ගමන්ම අර කෑ ගහන ළමයි ඔක්කොම නිශ්ශබ්ද වෙනවානෙ සම්පූර්ණ සංවර වෙනවනේ. එයාගේ තියෙනවා එහෙම ගතියක්. අනිත් අය තමාට නම්මගන්න - අනිත් අය තමා යටතට ගන්න - අනිත් අයව නිකං තමාගේ

බලයක් නිසා පාලනය කර ගන්න ගතියක් ඕකේ තියෙනවනේ. ආන්න එහෙම ධර්ම තියෙනවා. ඒකියන්නේ දැන් මේ සිත් කියන ඒව පුද්ගලයෝ නෙමෙයිනේ - ආත්ම නෙමෙයි - ජීව නෙමෙයිනෙ. ඊළගට චෛතසික කියල කියන්නෙත් පුද්ගලයෝ ආත්ම ජීව නෙමෙයිනෙ. රූප කියන්නෙත් පුද්ගලයෝ ආත්ම ජීව නෙමෙයිනේ. නිවන කියන්නෙත් එහෙම ආත්මයක් ජීවයක් පුද්ගලයෙක් නෙමෙයි. ඉස්කෝලේ මහත්තයා කියන්නේ ජීවයක් ආත්මයක් පුද්ගලයෙක් නෙමෙයි. ඔය සම්මුති ලෝකේ විදුහල්පති උනාට ඇත්තම පරමාර්ථ ධර්මයේ එහෙම එකක් නෑ. පුද්ගලයෙකුත් නෑ. විදුහල්පති කෙනෙකුත් නෑ විදුහලකුත් නෑ. සම්මත ලෝකේ දරුවෝ ඉගෙන ගන්නවා. සම්මත ලෝකේ දරුවෝ ශිෂ්‍යයෝ ඉන්නවා. පරමාර්ථ වශයෙන් ගිහිල්ලා බැලුවට පස්සේ එහෙම ඉගෙන ගන්න ශිෂ්‍යයකුත් නෑ ඉගෙනගන්න දරුවෙකුත් නෑ. ඉතින් ඔය ස්වභාවයනේ තියෙන්නේ. එතකොට පංච සකන්ධයක් කියන්නාවූ ධර්ම ස්වභාවයක් තවත් පංච ස්කන්ධයක් කියන්නාවූ ධර්ම ස්වභාව සමූහයකට කිට්ටුවෙන කොට මේ එක පංච ස්කන්ධයක් ඉන්නවා අනිත් පංච ස්කන්ධ ටික නිකං අමුතු විදියක ආකාර ස්වරූපයකට පරිවර්තනය වෙනවා. ඉතින් මේ එක පංච ස්කන්ධයක තියෙනවා නේද අනිත් ඒවා යම් කිසිවෙනස් කිරීමේ ගුණ සවභාවයක් - ගති සවභාවයක් - අධිපති බවක් leadership එකක් අමුතු ගතියක් තියෙනවා. අන්න ඒ වගේ අනිත් ධර්ම වලට අනිත් ධර්ම සමුදායක් - අනිත් ධර්ම රාශියක් - අනිත් ධර්ම ගොඩක් තවත් ධර්මයකට නතු කරගන්න පාලනය කරගන්න control කරගෙන යටතට පත්කර ගන්නා ගති සමහර ඒවගේ තියෙනවා.

අපි සරලව බැලුවොත් එහෙම ආහාර වලට මිරිස් වැඩි උනායින් පස්සේ ඒ මිරිස් වල තිබෙනවා මිනිස්සු කෑ ගස්සන ගතියක් තිබෙනවා. කඳුළු වක්කරවන ගතියක් තියෙනවා. නහය බුරුල් කරවන ගතියක් තියෙනවා. ඒවගේම වතුර ඉල්ලන ගතියක් තියෙනවා. ඒ තරම් බලයක් ඒකෙ තියෙනවා. ඒවගේම තියෙනවා ලුණු. ලුණුවල තියෙනවා කෑමට වැඩි උනොත් එහෙම ඒ කෑම එපාකරවන ගතිය. කෑම උයපු එක්කෙනාට බණිනවන ගතිය. ලුණු දාපු එක්කෙනාට බණිනවන ගතිය. ඒ වාගේම පිළිකුල් කියල ගොඩක් වචන කථා කරවන ගතිය. ඒවගේ මහා ගොඩක් තියෙනවා. ඒක අධිපති සවභාවයක්. ආන්න ඒ වගේ අනිත් ධර්මයක් තමාට නතුකරගන්න - පාලනය කර ගන්න - යටත් කර ගන්නාවූ ධර්ම වලට - ඒ හැකියාව තිබෙන ඒවාට කියනවා අධිපති ප්‍රත්‍යය සවභාවය තියෙන ධර්ම කියල. දැන් ඔය විදියට තියෙනවා.

අනිත් එක මේ අධිපති භාවයෙන් leadership එකේ හැටියට උපකාර වන ධර්ම සමුදායෙ තිබෙනවා ධර්මතා දෙකක් - එකක් තමයි 'අරමුණක් හැටියට අධිපති'

වෙනවා ඊළගට 'එකට උපදින්නාවූ ධර්මයක්' හැටියට අධිපති වෙනවා. ආරම්මණ යක් හැටියට අධිපති වෙන එකට කියනවා 'ආරම්මණ අධිපතිත්වය' කියල. එකට උපදින ධර්මයක් හැටියට අධිපති වෙනවට කියනවා 'සහජාත අධිපතිත්වය' කියල. ඒක නිසා අධිපති ප්‍රත්‍යය විස්තර කරනවා ආකාර දෙහෙකට. අපේ පින්වතුන් හැම දෙනාම මේ දෙකම ඉගෙන ගන්ට ඕනෑ. දෙකම දැන ගන්ට ඕනෑ.

අධිපති ප්‍රත්‍යය විධි 'දෙකක්' වෙනවා. 'ආරම්මණ අධිපති විදිය' සහ 'සහජාත අධිපති විදිය' කියල. ඒක අපි මෙහෙම තේරුම් ගනිමු. දැන් අපි මේ දවස්වල කථා කරානේ අරමුණු පිළිබඳව. එතකොට අරමුණක් ගත්තම ඒ අරමුණේ තිබෙනවා කිව්වා නිකං තමාගේ පැත්තට තමාගේ දිසාවට ටිකක් අද්දවල ගන්න ගතිය. අද්දවල හරවල තියාගෙන තමන් ගැන වැඩිපුර හිතවන ගතියක් තියෙනවා කිව්වනේ. ඒක වෙන්නේ අර අරමුණේ තිබෙන්නාවූ සිත් නම්මගන්න - සිත් බැඳ ගන්න - සිත් අල්ල ගන්න ශක්තියක් ඒකෙ තිබෙන නිසා. ඒකනේ අරමුණට බරවෙලා නැම්ලා හිත් පහළ වෙන්නෙ. එහෙම එකක් තියෙනවා. එහෙම වෙන්නේ අරමුණට තිබෙනවා අමුතු බලයක් - අර තාත්තට වගේ අර විදුහල්පතිවරයාට වගේ ආරම්මණ ප්‍රත්‍යය විතරක් නෙමෙයි ඔය අරමුණක තිබෙන්නේ. ඕකේ තියෙනවා ආරම්මණ අධිපතිත්වයත් තියෙනවා. එක වෙලාවකට අරමුණ 'ආරම්මණ ප්‍රත්‍යයෙන්' ප්‍රත්‍යය වෙනවා. 'ආරම්මණ අධිපති ප්‍රත්‍යයෙනුත්' ප්‍රත්‍යය වෙනවා. දෙහෙකින් ප්‍රත්‍යය වෙනවා. අපි මෙහෙම හිතමු.

විදුහල්පති වරයෙකුට දරුවෝ දෙන්නෙක් ඉන්නවා. ඒ දරුවෝ දෙන්නත් ඉස්කෝලේට එක්ක යනවා. ඒ දරුවෝ දෙන්න ඉගෙන ගන්නෙත් විදුහල්පති වරයා වැඩ කරන ඉස්කෝලේ. ඉතින් මොකක්හරි කාරණේකට මේ විදුහල්පති වරයා යනවා ඉස්කෝලෙන් එළියට. දැනගත්ත ගමන් අනිත් ළමයි එක්ක එකතුවෙලා මෙයාගේ දරුවෝ දෙන්නත් කෑගහනවා. දුවනවා නටනවා අනිත් අයට වද දෙනවා කෑ ගහගෙන යනවා. දැන් විදුහල්පති වරයා එනවා . එනකොට මේ ළමයි දෙන්න අනිත් අයට පීඩා කරන එක - ගහන එක බණින එක ඔක්කොම ටික නවත්වලා එක පාරම නවතිනවා, ඒ කරුණු දෙකක් නිසා. එකක් තමයි විදුහල්පතිවරයා එන නිසා මේ ළමයි නවතිනවා. ඒ වගේම තමයි තාත්තා එන නිසා නවතිනවා. එක අවස්ථාවකදී ධර්මතා දෙකක් තියෙනවා. එකක් තමයි පියතුමා කියන ගතියත් බලපානවා. විදුහල්පතිවරයා කියන එකත් බලපානවා. අරමුණක් ගත්තයින් පස්සේ අරමුණ චිත්ත චෛතසික ධර්මයන්ට ආරම්මණ ප්‍රත්‍යය යෙනුත් ප්‍රත්‍යය වෙනවා අධිපති ප්‍රත්‍යය යෙනුත් ප්‍රත්‍යය වෙනවා. ඒ ප්‍රත්‍යය වන වෙලාවේ නිකං ප්‍රත්‍යය වෙන්නේ නෑ ආරම්මණ අධිපති ප්‍රත්‍යය

යෙනුත් ප්‍රත්‍යය වෙනවා. හේතුව ඒකෙ තිබෙනවා අමුතු leadership එකක්. එකක් තමයි විශේෂයෙන්ම හිතෙන් ලොකුවට ප්‍රධානත්වයට දාල ගරුත්වයෙන් ගන්න අරමුණු තිබෙනවා. ඒ අරමුණු වලට කියනවා ඉෂ්ට අරමුණු කියල. හොඳ අරමුණු - ලොකු අරමුණු - ඒවගේ අරමුණු දැන් කොහොමද අපි ඕක හිතා ගන්නේ? ප්‍රංශෙ ගැන හිතන්නකෝ. ප්‍රංශය ගැන හිතපු ගමන්ම අර තියෙනවනේ අර කුලුණක්. ඒ කුලුණ අමතක කරන්න බැනේ. ඒ කුලුණේ තියෙනවා නිකං ලොකු ගතියක්. ප්‍රංශය ගැන හිතන කොට කුලුණෙහි තිබෙනවා ලොකු ගතියක්. ඉතින් කුලුණ ගැන හරි ගොඩක් කථා කරනවා. හිතනවා. එහෙම එකක් තියෙනවා. ඒවගේ සමහර අරමුණුවල තිබෙනවා හරි ලොකු හයිය ගතියක්. ඉෂ්ට ආරම්මණයෙ තිබෙනවා අන්න එහෙම ස්වභාවයක්. ඊළඟට ඔය වගේ හිත්වලට ලොකුවට ලොකුවට අහුවෙන්නාවූ - ගරුකරලා - ප්‍රධානත්වයට දාල - ඒවගේම ලොකුවට හිතල ගන්න අරමුණු තියෙනවා. ඒවගේ තිබෙනවා 'ආරම්මණ අධිපති ස්වභාවය' 'හොඳට' 'හොඳට' තියෙනවා. හැම එකටම හොඳට තියෙනවා සමහර ඒවගේ. ඒකට කියනවා ආරම්මණ අධිපති සවභාවයෙන් අරමුණු වෙනවා සහ බලපානවා චිත්ත චෛතසික ධර්මයන්ට කියල.

තව එකක් තිබෙනවා - දැන් අධිපති ස්වභාවය තේරුම් ගන්ට ඕන. ආරම්මණාධිපති සහ සහජාතඅධිපති කියල. සහජාතඅධිපති කියල කියන්නේ මෙහෙමයි. ධර්මතා හතරක් තිබෙනවා. ඡන්ද - චිත්ත - විරිය - විමංසා කියල. මෙ ධර්මතා හතරක් එක්ක ධර්ම පොකුරක් තමයි ඔය සිත්වල පහළ වෙන්නේ. අපි හිතමු ලෝභ සිතක් පහළ උනා කියල. ලෝභ සිත පහළ වෙන්නේ තනියෙන් නෙමෙයිනේ. ලෝභ හිතක් පහළ වෙන්නේ තවත් චෛතසික ධර්ම රංචුවක් එක්කනේ. ඒ රංචුවට කියන්නේ සර්ව චිත්ත සාධාරණ - ප්‍රකීර්ණක - අකුසල ආදී ඔහොම කියනවනේ. මොන මොන නම් වලින් කිව්වත් ඒ හිත ඇතුලේ චෛතසික ධර්ම පොකුරක් තියෙනවා. රංචුවක්. ඔය රංචුවත් එක්ක තමයි ඔය හිත වැඩ කරන්නේ. ඉතින් ඒ ධර්ම රංචුව ආවම පස්සේ එකේ අස්සෙත් ඉන්නවා ප්‍රධානත්වය දරන ධර්ම. ඒකට කියනවා 'සහජාත' = 'එකට උපන් ධර්මයන්' අතර පවතින අධිපති සවභාවය දරන ධර්ම කියල. ඒ තමයි ඡන්ද - චිත්ත - විරිය - විමංසා. චෛතසික ධර්ම වශයෙන් 3 යි සිත් වශයෙන් 1 යි. 'ඡන්ද විරිය විමංසා' කියන ධර්ම කියන්නේ 'චෛතසික ධර්ම' – 'චිත්තය' කියල කියන්නේ 'හිත'. මේ කියන ධර්මතා 4 එක වෙලාවකට එක්කෙනෙක් ප්‍රධානයි. 'ඡන්දය' සමහර වෙලාවට - සමහර වෙලාවට 'හිත' සමහර වෙලාවට 'විරිය' සමහර වෙලාවට 'විමංසාව'. ඔය විදියට ප්‍රධාන වෙනවා. ඊළගට ඒ ප්‍රධාන වෙලා පවතින තව තියෙනවනේ අනිත් ධර්ම චෛතසික ධර්මයි හිත් ටිකයි ඒවා තමයි ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට සලකන්නේ. දැන් එතකොට අපි දැනගන්ට ඕනෑ

මොනවාද? දැනගන්ට ඕනෑ මේ අධිපති කියල කියන්නේ - එකට චිත්ත චෛතසික ධර්ම සමුදායක පහළ උනොත් ඒ චිත්ත චෛතසික ධර්ම සමුදායේ නිකන් පාලන අධිපතිත්වය ගත්ත වගේ leadership එකක් අරගෙන ක්‍රියාත්මක වෙන ධර්ම සවභාව තියෙනවා. ඒ ධර්ම සවභාව වලට - ඒකට කියනවා සහජාත අධිපති ප්‍රත්‍යය ධර්ම කියලා.

ඊළඟට තව එකක් තියෙනවා ආරම්මණයක් හැටියට ඉදිරිපත්වෙලා ඒකත් අධිපතිත්වයෙන් ක්‍රියාත්මක වෙනවා. හේතුව මතක තියාගන්න - එක ධර්මයක් තවත් ධර්මයකට උපකාර වෙන්නේ එකම විදියෙන් නෙමෙයි. ඒකයි මේ පට්ඨානයේ තිබෙන තවත් වැදගත් කම.

එකක් තියෙනවා - එක ධර්මයක් පහළ වෙන්නේ එකම හේතුවක් නිසා නෙමෙයි. හේතු රාශි ගොඩාක් තියෙන්න ඕන වටේ. උපකාරක ධර්ම ගොඩාක් තියෙන්න ඕන. උපකාරක ධර්ම ගොඩකින් තමයි එකක් හැදෙන්නේ. ඒවගේම තමයි යම්කිසි ධර්මයක් තවත් එහෙකට උපකාර වෙනකොට එකම විදියට නෙමෙයි උපකාර වෙන්නේ, ඒකේ තියෙනවා උපකාරවීම් කීප ආකාරයක්. ඒක නිසා මේ එකම ධර්මයකට සහ රංචුවකට මේ අරමුණ ආරම්මණයක් හැටියටත් ප්‍රත්‍යය වෙනවා ඒ අරමුණ අධිපති ධර්මයක් හැටියටත් ප්‍රත්‍යය වෙනවා. ඒකත් තේරුම්ගන්න ඕනෑ.

හොඳයි මම මේ වෙලාවේදී මේ පින්වතුන්ට මතක් කරේ ඔය තවත් අපිට සාකච්ඡාවට ඉදිරිපත් වන කරුණු ටිකක්. ඒකෙ තිබෙනවා අධිපතිත්වය ගත්තයින් පස්සේ ඒකෙත් තියෙනවා අර විදියටම ධර්මතා - ප්‍රත්‍යය උප්පන්න ධර්ම තියෙනවා. ප්‍රත්‍යය වෙන්නාවූ ධර්ම තියෙනවා. ඒවගේම ප්‍රත්‍යනීක වන ධර්මත් තියෙනවා. අපි ඒ ටික ඊළඟ අවස්ථාවේදී කථා කරමු සාකච්ඡා කරමු. ඉතින් අපි මේ වෙලාවේදී පිංවත් හැම දෙනාම එක්කාසු වෙලා මේ ධර්මමණ්ඩලයට ගොනුවෙලා හිත් වලින් සම්බන්ධ වෙලා මේ බණ අහන්ට - හිතන්ට - මෙනෙහි කරන්ට පෙළ ගැහි ඉන්ට එක ගැන අපි බොහොම කරුණාවෙන් මෛත්‍රීයෙන් යුක්තව සිහිපත් කරනවා සහ හැම එක්කෙනාටම යම් ධර්ම පිපාසාවක් තිබෙනවා. ධර්ම දැනුමත් හොඳට තියෙනවා. සමහර අයගේ ධර්ම දැනුම හොඳට තියෙනවා. ඒ වගේම යම් යම් තැන් වලදී ප්‍රශ්න වශයෙන් අහල පොඩි පොඩි පැහැදිලි කර ගැනීම් අවශ්‍යයයි. ඒ ඇරෙන්ට හොඳ දැනුමක් ලබාගෙන තියෙනවා. ඒක ඇත්ත වශයෙන්ම ප්‍රශංසා කරලා කියන්ටත් ඕනෑ. දැන් තවත් එකක් තමයි, අපිට හම්බ වෙනව භාවනා කරපු - භාවනා කරන අය. සමහර වෙලාවට කොච්චර භාවනා කරත් බණ ඇහුවත් ධර්ම සාකච්ඡා කරත් අර අපි ගෙනාපු තියෙනවනේ මහා

බරපතල චින්තන විදියක්. ඒ කියන්නේ අපි ලෝකය ගැන හිතනවා. ලෝකයට සම්බන්ධ දේවල් ගැන අදහස් කරනවා. කථා කරනවා. අර පුද්ගල සංඥාව පොඩ්ඩක්වත් යන්නේ නැනේ අහකට. නිකන් අර කථා කරන වෙලාවට යට යනවා පොඩ්ඩ ගස්සිච්ච ගමන් නැති කරපු පුද්ගලයෝ - නැති කරගෙන යන පුද්ගලයෝ - ධර්මයෙන් ගහ ගහ - ගහ ගහ වට්ටවන පුද්ගලයන් හිටපු ගමන් ඔලුව උස්සලා එනවා නිකං මහා ආත්ම සංඥාවෙන් දෘෂ්ටියෙන් මහා විදියට එනවා. අරව අයින්වෙන්නේ නැත්තේ ඒ තරමටම මේක මහා බලවත් විදියටම කා වැදිලා නිසා. ඉතින් මේක කොහොම හරි ඔය වැටෙන්ට ගහල ගහල ගහලම තමයි මට්ටු කරගන්න ඕන. ඒකනිසා මේ ධර්ම සාකච්ඡාව ඇසීම ඒ සඳහා විශ්ෂයෙන් උපකාර වෙනවා. ඉතින් අපේ පිංවත් සැම දෙනාටම නැවත වතාවක් හමුවෙලා ඒවගේම ඉස්සරහදි ඔය - ඉස්සරවෙලා අපි මේ ටික කියාගෙන යමු මේ විදියට ඊට පස්සේ අපි තව තව - තව තව අරගෙන එක එක - එක එක අරගෙන ලස්සනට මේකේ විස්තර කරලා ඒවත් අරගෙන සාකච්ඡා කරල, ඉතින් අපි සසර දුකෙන් මිදෙන්ට - මිදීයන්ට මේ ධර්මය උපකාර කරගනිමු. ඒ නිසා මේ වෙලාවේදී මේ ඇහීමෙන් හිතීමෙන් මෙනෙහි කිරීමෙන් උපදවාගත්ත සියලු පිං බලයෙන් සැමදෙනාටම ධර්ම අවබෝධය වේවා කියල අපි මෛත්‍රියයෙන් ප්‍රාර්ථනා කරනවා. මොනවා හරි තියෙනවනම් අහන්නත් පුළුවන්. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස - හසිත උත්පාද සිතට අරමුණු වන ප්‍රත්‍යය කුමක්ද? එතනදී ආරම්මණ ප්‍රත්‍යය වශයෙන් යෙදෙන්නේ කුමක්ද?

<u>පිළිතුර</u> - හසිත උත්පාද සිත ඇවිල්ල ලෝකෝත්තර සිතක්. ඒ ලෝකෝත්තර සිතට කුමක් හෝ දෙයක් අරමුණු වෙන්ට පුළුවන්. සත්ව ආරම්මණයක් විශේෂයෙන්ම. ඒවගේම කර්ම ආරම්මණයක් - චිත්ත ආරම්මණය ක් ඒවගේම තමයි තමන් ගැන හිතෙන්ට පුළුවන්. ඒකට උදාහරණ තියෙනවා. බුදුරජාණන්වහන්සේගේ හිතේ පහළ වෙච්ච විදිය. දැන් ඔය ඊරියක් දැක්ක කියනවනේ බුදුරජාණන්වහන්සේ එතකොට සිනා පහළ කරනවනේ. ඒ කියන්නේ එතනදී ඒ පහළ වෙන්නේ සත්වයාට වෙච්ච විපත ගැන නෙමෙයි හිනා වෙන්නේ. සත්වයාට වෙච්ච විපත ගැන නෙමෙයි - ලෝකයේ හේතු ඵල ධර්මයන්ගේ තියෙන බොරු පරිවර්තනවීම් දැක්කයින් පස්සේ එතැනදී ඒ අරමුණු වෙලා තමයි ඒ සිනහව පහළ වෙන්නේ. අනිත් එක තමයි කර්මයක් විපාක දෙන්ට එන විදිය. කර්මයක් කරලා තියෙනවා කෙනෙක් ඒක දැන් විපාක දෙනවා. එහෙම නැත්නම් අනාගතයේ විපාක දෙන්ට යනවා. එතකොට එතනදී අරමුණු වෙන්නේ කර්මය. කර්මය මෙන්න මේ විදියට මේ කෙනා දැන් ඉන්නේ

මෙතන - මේ තත්වය - මේ ස්කන්ධ පංචකය අහවල් තැනදී මෙන්න මේ විදියට බැබලෙනවා - එතකොට කර්මය ආරම්මණය වෙනවා. ඒවගේම තමයි තමන් අරමුණු වෙනවා - ඔය රහතන් වහන්සේලාට එහෙම යම් කිසිකෙනෙක් දිහා එහෙම දැක්කයින් පස්සේ එයා දුක් විදිනවා හැබැයි ඒ දුක විඳින කෙනා දිහා බලල නෙමෙයි හිනා වෙන්නේ සතුටු වෙන්නේ තමන් අරමුණු වෙලා. මම එතන නෑ කියල.

දන් අපි හිතමු මේක උදාහරණයක් වශයෙන් කිව්වොත් එහෙම මෙහෙම වෙනවා. දැන් ළමයි ටිකක් ඉන්නවා. ළමයි දහ දෙනෙක් ඉන්නවා. ඒ ළමයි දහ දෙනාගෙන් පස් දෙනෙක් එකතුවෙලා තිබෙන්නාවූ අඹ ගහකට ගහනවා. අඹ ගහකට ගහලා ඉතින් අඹ අතු කඩලා ඒවායින් ගෙවල් වලටත් වැඩිලා දැන් මහා නඩුවක් ගෙතිලා තියෙන්නේ. දැන් එතකොට පස් දෙනෙක් ඒකට සම්බන්ධ උනේ නෑ. පස් දෙනෙක් අරකට සම්බන්ධ උනා. දැන් ගමේ මිනිස්සුත් ඇවිල්ල දැන් මේක අහනවා කියනවා දැන් ඉස්කෝලෙටත් ඇවිල්ල දැන් මෙහෙම තියෙනවා. දැන් මේ නඩුව විසඳන වෙලාවේ අර ගියේ නැති අයගෙන් අහනවා - මේ ළමයත් ගියාද මේ ළමයත් ගියාද කියල ඒ ළමයි කියනවා 'අපෝ අපෝ අපි ගියේ නෑ', බොහොම සන්තෝසෙන් 'මම නම් ගියේ නෑ' කියල අර අමුතු හිනහවකින් කියනවා. ඒ කියන්නේ තමන්ගේ තිබෙන ඍජු භාවයනේ. අනිත් අය ඒකට ගිය හින්ද ඒගොල්ලො විපතට පත් වෙච්ච හින්ද නෙමෙයි ඒ සතුටු වෙන්නේ. 'මම ඒකට ගියේ නෑ' 'අනේ මම නම් ගියේ නෑ' එතකොට මම බේරිච්ච එක පිළිබඳව 'අනේ මම නම් ගියේ නෑ' 'අපෝ අපෝ' කියල හරි හිනාවකුත් දානවා. ආන්න ඒ වගේ 'කර්මය' ආරම්මණය වෙනවා ඒ ක්‍රියා සිතට. ඒවගේම සත්ව ආරම්මණය වෙනවා - තමන් අරමුණු වෙනවා - හේතු ඵල ධර්ම අරමුණු වෙනවා. අන්න ඒවා තමයි අරමුණු වෙන්නේ. තෙරුවන් සරණයි!

අවසරයි ස්වාමීන්වහන්ස එකේදී පොඩි නිවැරදි කිරීමක් කරගන්න පුළුවන් නම් හොඳයි කියල හිතුන ස්වාමීන්වහන්ස හසිත උත්පාද හිත. ඒක අහේතුක ක්‍රියා හිතක් නේද සවමීන්වහන්ස තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - අනිවාර්යෙන්ම ඒක අහේතුක සිත් 18 එකක්. අහේතුක සිත් 18 කියල කියන්නේ එතනදී විපාක උපදින්නාවූ ගතියක් සහ ඒවාගේම ක්‍රියා මාත්‍ර ප්‍රමාණයක් පමණයි.

ස්වාමීන්වහන්ස ඒකෙම තව ප්‍රශ්ණයක් තියෙනවා ඒ අරමුණුම 'අධිපති ආරම්මණ ප්‍රත්‍යය' වෙන්න පුලුවන්ද ඒවගේම 'සහජාත අධිපති ප්‍රත්‍යය' වෙන්න පුලුවන්ද කියලත් අහල තියෙනවා ස්වාමීන්වහන්ස.

ඒක ගැන පටලැවිල්ලක් තියෙනවා ඒක බෙර ගන්න ඕන. මෙහෙමයි වෙන්නේ. අපි හිතමු මෙහෙම වටිනා මුතු කියල. අපි හිතමු ගජ මුතු කියල. ඒක වටින වස්තුවක්නේ. දැන් මේ ගජමුතු ගැන හිතනවා. ගජමුතු ගැන හිතන කොට ඒ ගජ මුතුගැන හිතෙන් හිතනවා. ඒ ගජ මුතු ගැන හිතන හිත් ටික පහළ වෙන්නේ අර ගජ මුතු කියන අරමුණ අල්ලගෙන. එතකොට 'ආරම්මණ ප්‍රත්‍යයත්' - ගජ මුතුවල 'අධිපති ප්‍රත්‍යය' ආරම්මණය පැත්තටත් තියෙනවා. හැබැයි 'සහජාත ප්‍රත්‍යය' නෑ. සහජාත ප්‍රත්‍යය එන්නේ ආරම්මණය පැත්තට නෙමෙයි. ඒක පහළ වෙන්නේ ප්‍රත්‍යය උප්පන්න ධර්ම පැත්තටයි. දැන් ඒ ගජ මුතු අරමුණු කරගෙන හිත් පහළ වෙනවා. ගජමුතු අරමුණු කරගෙන චෛතසික පහළ වෙනවා. ඒ පහළ වෙනකොට අරපැත්තෙන් ආරම්මණ අධිපති වෙනවා මේ පැත්තෙන් සිද්ධ වෙනවා ධර්මතා හතරක් සහජාත සවභාවයෙන් ක්‍රියාත්මක වෙනවා. සහජාත ධර්ම අධිපතිත්වය තියෙන්නේ අරමුණ පැත්තට නෙමෙයි ඒක හිත පැත්තටයි තියෙන්නේ. ඒක නිසා ඡන්දය පහළ වෙන්නේ අර අරමුණු කරන්නාවූ අරමුණ දැන ගන්න හිත් පැත්තේ. එතකොට චිත්තය පහළ වෙන්නේ අර අරමුණ දැන ගන්න හිත් පැත්තට බර වෙන්න. ඊට පස්සේ විමංසාවත් හිත පැත්තටයි. වීර්යයත් හිත පැත්තටයි. ඒක නිසා මේ ආරම්මණ අධිපතිත්වය - සහජාත අධිපතිත්වය ගැන ගන්න කොට එකක් අරමුණ පැත්තට යනවා අනෙත් එක ඒ අරමුණ දැන් ගන්න හිත පැත්තට යනවා. සහජාත අධිපති හැටියට සලකන්නේ ධර්මතා 4 යි. ඒ තමයි ඡන්දය චිත්තය විරිය විමංසා. තෙරුවන් සරණයි!

සවාමීන් වහන්ස එතකොට ඍද්ධිපාද කියන්නෙත් ඕවමනේ. එහෙම සම්බන්ධයක් තියෙනවද ඍද්ධිපාද සහ සහජාත අධිපති ප්‍රත්‍යය අතර. තෙරුවන් සරණයි!

ඔය ධර්මතා හතරම තමයි ඍද්ධිපාද ධර්ම හැටියට බාර ගන්නේ. දැන් මෙතැනදී අධිපතිත්වය හැටියට සලකන්නේ අර අරමුණක් දැන ගැනීමේදී ඒ අරමුණ දැනගන්ට ක්‍රියාත්මක වෙන්නාවූ හිතයි ඒ අරමුණ දැන් ගන්න ක්‍රියාත්මක වෙන්නාවූ චෛතසික ධර්ම මණ්ඩියේ ඔය හතරෙන් එක වතාවකට එක්කෙනෙක් විතරක් - හතරම වෙන්නේ නැහැ - එක වතාවකට එක්කෙනෙක් විතරක් ඉලිප්පිලා, එක්කෝ හිත වෙන්න පුළුවන් එහෙම නැත්නම් වීර්ය වෙන්න පුළුවන් එහෙම නැත්නම් විමංසා වෙන්න පුළුවන් ඡන්දය වෙන්න පුළුවන් ඒවා ඉලිප්පිලා

leadership එකක් අරගෙන ක්‍රියාත්මක වෙනවා. එතැනදී ඒක අධිපතිත්වයෙන් වැඩ කරනවා. හැබැයි ඒ හතර සෘද්ධිපාද හැටියට වැඩ කරනවා අර සෘද්ධිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනකොට. ඒක නිසා මේ හතරම සෘද්ධිපාද වෙනවා සෘද්ධිපාද හැටියට කථා කරනවා - අර සෘද්ධි සම්බන්ධ කරන කොට. මෙතෙන්දී  තියෙන්නේ සහජාත ස්වාභාවයේදී සහජාත අධිපතිත්වය හැටියට සලකන ගතියයි.

නැවත අවසරයි ආරම්මණාධිපති ප්‍රත්‍යය යෙන් බලන කොට ස්වාමීන්වහන්ස කුසල පක්ෂයේ තිබෙන සිතුවිලි පමණද අධිපති භාවයෙන් අරමුණු වෙන්නේ ස්වාමීන්වහන්ස. දැන් අකුසල් සිතක් ගත්තොත් ස්වාමීන්වහන්ස මෝහය කියන එක ඒ අවස්ථාවේදී අධිපති වෙනවද සවාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - දෙපැත්තෙන්ම වෙනවා. ගොඩක් ලෝභ මූලික සිත්වල. ලෝභ මූලික සිත්වලින් - ඒ කියන්නේ ආරම්මණයක් තද බල ලෙස ගන්න ගතිය තියෙන්න - කුසල් පැත්තෙන් අනිවාර්යයේනම සිදුවෙනවා, ඒක හැබෑව. අකුසල අතින් ගත්තොත් එහෙම ලෝභ මූල හිත්වල තමයි. අපි හිතමු ලෝභය වැඩෙන්නාවූ දෙයක් ඇති උනායින් පස්සේ වැඩි වැඩියෙන් - වැඩි වැඩියෙන් හිතනවා හිතනවා - එහෙම තියෙනවනේ ඒවගේ තියෙනවා ගතියක්. අර විමංසාව ගත්තයින් පස්සේ කුසල පැත්තේ. වීර්ය කියන එක කුසල් වෙන්න පුළුවන් අකුසල වෙන්න පුළුවන්. ඡන්දය කියන එක කුසල වෙන්න පුළුවන් අකුසල වෙන්න පුළුවන්. චිත්තය කියන එකත් දෙපැත්තටම යන්න පුළුවන්. ඒක නිසා ලෝභ මූල සිත්වල ප්‍රධානයෙන්ම අකුසල පැත්තට ගියාට පස්සේ අනිත් ඒවගේ කුසල් ටික. සාමාන්‍යයෙන් ඕකෙදි සලකන්නේ සිත් 84 ක් විතර. අනිත් ඒවා අධිපතිත්වය දරන විදියට සලකන්නේ නෑ.

බොහොම පින් ස්වාමීන්වහන්ස

තෙරුවන් සරණයි !

<u>ප්‍රශ්නය</u> - අවසරයි සවමීන්වහන්ස මට හිතුන ස්වාමීන්වහන්ස සාමාන්‍යයෙන් අපි ජීවත් වෙන කොට ලෝකේ ලෞකිකත්වයදී අපිට දැන් සත්ව පුද්ගල විදියට හිතන්න වෙනවනේ. එතකොට කොහොමද ඔබවහන්සේ කියන ධර්‍මයත් එක්ක අපි හැමතිස්සෙම හිතට දෙනවා ඔබ ජීවත්වෙන්නේ ශක්තීන් ටිකක් එක්ක විතරයි, එතකොට මේ ශරීරයත් මේ හැම දෙයක්ම අභාවයට යනවා කියන එකත්

අපි හිතට දෙනවා දෙනවා දෙනවා නිතරම. එහෙම දුන්නහම අපි හිත පුරුදු කරනවා ඒකට. ඒ විදියට පුරුදු කරහම අපි එතකොට සත්ව පුද්ගල භාවයෙන් මිදීමක් වෙනවද ස්වාමීන් වහන්ස. අපිට හම්බ වෙන හැම අවස්ථාවකම අපි හිතට දෙනවා.

<u>පිළිතුර </u>- ඒක එහෙම තමයි. සත්වයෙක් හැටියට බාර අරගෙන තිබෙන්නාවූ ගතිය හිතේ තද බල විදියට කා වැදිලා තියෙනවා. ධර්මය කිට්ටු කරගෙන අහන වෙලාවට ඒ ඒ වෙලාවට ධර්ම ශක්තීන් ස්වභාවයක් විතරයි මේ තියෙන්නේ කියල මෙනෙහි වෙච්ච වෙලාවට තදංග වශයෙන් ඒක යට යනවා. ආයිත් ඊට පස්ස උඩට එනවා. ආයිත් බණක් අහන කොට තදංග වශයෙන් යටට යනවා. ආයිත් ගෙදර දොරේ වැඩ කටයුතු කරන කොට ආයිත් එනවා පුද්ගල සංඥාව. ආයිත් මෙනෙහි කරන කොට ආයිත් යට යනවා ඔය විදියට තදංග වශයෙන් යටකර කර යටකර කර ගිහිල්ලා සමහර වෙලාවට හොඳට හිත සමාධි වෙලා යනකොට දවසක් දෙකක් දිගට අල්ල හිටිනවා. එතකොට විෂ්කම්භනය වෙනවා. ඒ කියන්නේ ටිකක් වැඩිපුර කාලයකට යට යනවා. ඉතින් ආයිත් උඩට එනවා. ඔහොම ඔහොම වෙලා අවසානයෙදී ඕක සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වෙලා යනවා. එතකල්ම ඉතින් මෙහෙම බැලුවට පස්සේ අපි මේ විදියට කථා කරන්න, කථා කරන්න අර තදංග වශයෙන් හරි ඒක යට යන්නෙ අවබෝධයක් එක්කනේ. කොච්චර වටිනවද ඒක.

බොහොම පිං ස්වාමීන්වහන්ස

<u>ජයන්ත මහතා</u> එහෙනම් සවාමීන්වහන්ස ඔබ වහන්සේගේ කාලවේලාව සලකල මේ ආකාරයෙන් සාකච්ඡාව නිමා කරන්න අවස්ථාව ඇවිල්ල තිබෙනවා. අදත් ඔබ වහන්සේ අපිට අනුකම්පාවෙන් ආරම්මණ ප්‍රත්‍යයත් ඒවගේම අධිපති ප්‍රත්‍යයයේ කොටසකුත් මතු කරලා දුන්න, මේවා හැමතැනකදිම අහන්න හම්බවෙන ධර්ම නෙවෙයි ස්වාමීන්වහන්ස, බොහොම විරලයි මේ පට්ඨාන දේශනා වල යෙදෙන මේ ප්‍රත්‍යය ගැන අපිට අහන්න ලැබෙන අවස්ථා. ඒවගේ අවස්ථාවක් අපට ලබා දීම ගැන අපි පුණ්‍යානුමෝදනා කර සිටිනවා ස්වාමීන්වහන්සේට. ඒවාගේම දළුවත්ත මහතා අපිට මේ අවස්ථාව සලසා දීල තියෙනවා ස්වාමීන්වහන්සේත් එක්ක එකතු වෙලා මේ ධර්ම කරුණු අපේ ශක්ති ප්‍රමාණයෙන් අවබෝධ කරගන්න. ඉතින් එතුමා තරමක අසනීපයෙන් පසුවන බව අපි දන්නවා. අපි රැස්කර ගත සියලු කුසල් එතුමාටත් අනුමෝදනා කරමින් ස්වාමීන්වහන්සේට යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න. සවාමීන්වහන්ස තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> -හොඳයි පිංවත් සැමදෙනාටම සැනසිල්ලක් වේවා තෙරුවන් සරණයි! අදත් අපි මේ අවස්ථාව සලසාගෙන ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ගාම්භීර වූ අතිශය පිරිසුදු වූ සූක්ෂම වූ සිතින් ප්‍රඥාවෙන් ස්පර්ශ කොට දැනගත්තාවූ අවබෝධ කරගත්තාවූ ඒ ධර්ම ස්කන්ධයේ පොඩි අංශු මාත්‍රයක්වත් තරම්වත් කියන්න බැරි ප්‍රදේශයක් තමයි අපි මේ දැනගන්න මහන්සි ගත්තේ. ඒකත් අපිට සැනසිල්ලක්. ඒ බුදුරජාණන්වහන්සේ දේශනා කලාවූ උන්වහසේ අවබෝධ කරගත්තාවූ ධර්මය - ඒ ධර්ම න්‍යායන්හි පිහිටා අපි අතරමං නොවී තේරුම් ගන්ට උත්සාහ කිරීම තුල ධම්ම විචය සම්බොජ්ඣංගය වඩා ගැනීමට අවස්ථාව සලසා ගත්තා. ප්‍රඥාව මෝරවා ගැනීමේ අවස්ථාව සලසා ගත්ත. තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව අවදි කරගන්න අවස්ථාව සලසා ගත්ත. ඒ එක්කම විර්යත් සතියත් සමාධියත් හදා ගන්න අවස්ථාව පත්කරගත්ත. මේ උපදවාගත්ත සියලුම කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් එම ධර්මයේ ආනුභාව බලයෙන් දේශනාකල බුදුරජාණන්වහන්සේගේ ධර්මයේ සංඝ රත්නයේ ආනුභාව බලයෙන් පිංවත් ලලිත් දළුවත්ත මහත්මයාට චිරාත්කාලයක් නිදුක් නිරෝගී දීර්සායුෂ වේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කළ යුතුයි සෙත් පැතිය යුතුයි. එතුමාට ඒ ගන්නාවූ ඖෂධ වර්ග බෙහෙත් හේත් සියල්ලක්ම යහපත් ප්‍රත්‍යය වූ දිව්‍ය ඖෂධ බවට පත්වේවා! ගන්න ආහාරපාන සියල්ලක්ම ප්‍රත්‍යය වේවා! ඒවගේම අතීත අකුසල කර්මබලවේග යටපත් වේවා! කුසල කර්ම බලවේග ශක්තිය මතුවේවා! ඉතින් ඒ පිංවත් මහත්මයාට සියලු අපලයන්ගෙන් දුරුවෙලා බාධකයන්ගෙන් දුරුවෙලා මිදිලා නිරෝගීමත් හිතක් නිරෝගීමත් කයක් සලසාගෙන ලෝකයට ධර්මයෙන් පිහිට වීමේ මේ වැඩ පිළිවෙල දිගට කරගෙන යන්න ශක්තිය ලැබේවා! කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. ඒ මහතමයාටත් ඒ පවුලේ සැම දෙනාටමත් - ජයන්ත මහතා අද ඉදිරිපත්වී මෙහෙයුවා ඒ පිංවත් මහතාටත් ප්‍රශ්න ඇසූ පිංවත් මහත්මා මහත්මීන්ටත් මේ සැම සියලුදෙනාටත් ලෝකවාසී සැම දෙනාටමත් මේ උතුම් පින - මේ උතුම් කුසලය තව තව විමර්ශනාත්මකව එළිපෙහෙළි කරමින් ගමන් කොට පිංවත් සැම දෙනාටම ගාම්භීර වූ සූක්ෂම වූ පරම ශාන්ත වූ නිර්වාණ ධාතුව අවබෝධකරගන්ට - නිවන උතුම් වූ ප්‍රඥාවෙන් සපර්ෂ කරන්ට ශක්තිය ලැබේවා! නිවනින් සියලුදෙනාගේම සිත් නිවී සැනසෙත්වා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.